# 1961 අංක 31 දරන
# ආයුර්වේද පනත

දෙසැම්බර්, 1962

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝර්පරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1/05 තැපැල් ගාස්තුව : ශත 25 යි

ඇල්. ඩී. ඕ. 25/58.

# 1961 අංක 31 දරන ආයුර්වේද පනත

ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධශාලා හා ආයුර්වේද බෙහෙත් ගබඩා ලියාපදිංචි කිරීම සඳහා ද; ආයුර්වේද වෛද්‍යවරුන් හා ආයුර්වේද ඖෂධ සංයෝගකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන් ලියාපදිංචි කිරීමට හා ඔවුන්ගේ වෘත්තීය හැසිරීම සම්බන්ධ කරුණු ගැන ක්‍රියා කිරීමට ආයුර්වේද වෛද්‍ය සභාවක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට හා ආයුර්වේද මහා රෝග්‍යශාලාවට ද, ඊට සම්බන්ධ ඖෂධ නිෂ්පාදනාගාරයට, ඖෂධ නිධියට හා ඖෂධශාලාවට ද අදාල වන යම් කටයුතු ඉෂ්ට කිරීම සඳහා ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේදය පිළිබඳ පර්යේෂණයට සම්බන්ධ යම් කටයුතු ඉෂ්ට කිරීම සඳහා ආයුර්වේද පර්යේෂණ කාරක සභාවක් පිහිටුවීම සඳහා ද, විධිවිධාන සැලැස්වීමටත්; 1941 අංක 17 දරණ ස්වදේශීය වෛද්‍ය ආඥාපනත හා ආයුර්වේද වෛද්‍ය සභා ආඥාපනත අවලංගු කිරීමටත්; වෛද්‍ය ආඥාපනතේ, වස, අබින් හා අන්තරායදායක ඖෂධ ආඥාපනතේ හා 1949 අංක 25 දරණ ආහාර හා ඖෂධ පනතේ ආනුෂංගික සංශෝධන කිරීමටත්; ඉහත කී කරුණු හා සම්බන්ධ වූ හෝ ඊට අදාල වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමටත් පනවනු ලබන පනතකි.

[අනුමතිය ලැබූ දිනය: 1961 ජූනි 2.]

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනු ව හා ඇති ව, එහි ම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙ සේ පනවනු ලැබේ.

1. මේ පනත 1961 අංක 31 දරණ ආයුර්වේද පනත නමින් හැඳින්විය හැකි ය. ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් නියම කරනු ලබන (මේ පනතෙහි මින්මතු "නියමිත දිනය" වශයෙන් හැඳින්වෙන) දිනයක මේ පනත වලංගු විය යුතු ය. ලුහුඬු නාමය හා වලංගු වන දිනය

## I වෙනි කොටස

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

2. 7 වෙනි වගන්තියෙහි නියමිත පරමාර්ථ ක්‍රියාවෙහි යෙදවීම සඳහා (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" වශයෙන් හැඳින්වෙන) ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු ය. ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවීම.

1——ආර් 5220—5850 (62/10)

*ආයුර්වේද කොමසාරිස් වරයා හා වෙනත් නිලධරයන් පත් කිරීම.*

3. (1) දෙපාර්තමේන්තු ප්‍රධානයා විය යුතු (මෙහි මින්මතු "කොමසාරිස්වරයා" වශයෙන් හඳුන්වනු ලබන) ආයුර්වේද කොමසාරිස්වරයා වශයෙන් හෝ ඒ වෙනුවෙන් වැඩ බැලීමට හැකි තැනැත්තකු පත් කළ යුතු ය.

(2) 7 වෙනි වගන්තියෙහි නියමිත පරමාර්ථ ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරුන්, සහකාර ආයුර්වේද කොමසාරිස්වරුන් හා වෙනත් නිලධරයන් ගණනක් පත් කළ හැකි ය.

*කොමසාරිස් වරයාගේ බලතල හා යුතුකම් පැවරීම.*

4. කොමසාරිස්වරයා විසින් තමාගේ යම් බලතල හෝ යුතුකම්, යම් නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයකුට හෝ සහකාර ආයුර්වේද කොමසාරිස්වරයකුට පැවරිය හැකි ය.

*නියෝජ්‍ය හෝ සහකාර ආයුර්වේද කොමසාරිස් වරයකුගේ යම් බලයක් හෝ යුතුකමක් ක්‍රියාවෙහි යෙදවීමට හෝ ඉෂ්ට කිරීමට යම් නිලධරයකුට බලය පැවරීම සම්බන්ධ ඇමතිවරයාගේ බලය.*

5. නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයකුගේ හෝ සහකාර ආයුර්වේද කොමසාරිස්වරයකුගේ යම් බලයක් හෝ යුතුකමක් ක්‍රියාවෙහි යෙදවීම හෝ ඉෂ්ට කිරීම සඳහා ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට බලය පැවරිය හැකි ය.

*ඇමතිවරයාගේ නියමවලට කොමසාරිස් වරයා යටත් විය යුතු බව.*

6. මේ පනත යටතේ තමාගේ යුතුකම් හා බලතල ක්‍රියාවේ. යෙද වීමේ දී හා ඉෂ්ට කිරීමේ දී,. ඇමතිවරයා විසින් කලින් කලට නිකුත් කළ හැකි සාමාන්‍ය හා විශේෂ නියමවලට කොමසාරිස්වරයා යටත් විය යුතු ය.

*දෙපාර්තමේන්තුවේ පරමාර්ථ.*

7. ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රදානය කරනු ලැබූ මුදල් තිබෙන ප්‍රමාණයට යටත් ව, පහත සඳහන් පරමාර්ථ ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වගකිය යුතු ය. එනම් :—

(අ) ආයුර්වේදය අනු ව රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා ද, සාමාන්‍යයෙන් මහජනයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම සඳහා ද අවශ්‍ය ආයතන හා සේවාවන් සැපයීම ;

(ආ) දෙපාර්තමේන්තුවෙහි සේවයෙහි නියුක්ත හෝ සේවයෙහි යෙදවීමට යෝජිත තැනැත්තන්හට ශිෂ්‍යත්ව හා වෙනත් පහසුකම් ප්‍රදානය කිරීමෙන් ද, ආයුර්වේදය සම්බන්ධයෙන් පාඩම් මාලා සපයනු ලබන හෝ පර්යේෂණ කටයුතුවල යෙදුණු ආයතනවලට මුදල් ආධාර හා වෙනත් උදව් ප්‍රදානය කිරීමෙන් ද, ආයුර්වේද ඉගෙනීම හා ඒ සම්බන්ධ පර්යේෂණ කටයුතුවලට ධෛර්ය දීම ; හා

(ඇ) ආයුර්වේදය අනු ව රෝග පරීක්ෂා කිරීම හා මහජන සෞඛ්‍යය දියුණු කිරීම සඳහා කටයුතු කිරීම, දියුණු කිරීම හෝ ඊට ධෛර්යය දීම.

## කොමසාරිස්වරයාගේ බලතල

කොමසාරිස්වරයා විසින් ආයුර්වේද ආරෝග්‍යශාලා ආදිය පිහිටුවීම හා පවත්වාගෙන යාම.

8. 7 වෙනි වගන්තියෙහි නියමිත පරමාර්ථ ඉෂ්ට කිරීමෙහි දී, කොමසාරිස්වරයා විසින් ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර හා ඖෂධ නිධි ; ආයුර්වේද ඖෂධශාලා හා ආයුර්වේද බෙහෙත් ගබඩා පිහිටුවා පවත්වාගෙන යා හැකි ය. නැතහොත් පිහිටුවීමට හා පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය හැකි ය.

කොමසාරිස්වරයා විසින් දෙනු ලබන මුදල් ආධාර.

9. 7 වෙනි වගන්තියෙහි නියමිත පරමාර්ථ ඉෂ්ට කිරීමෙහි දී, පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා සම්මත කරනු ලැබූ මුදල්වලින් යම් ගණනක්, ඇමතිවරයාගේ පූර්ව අනුමතිය ඇති ව කොමසාරිස්වරයා විසින්—

(අ) ආයුර්වේද වෛද්‍ය සභාවට ;

(ආ) ආයුර්වේද වෛද්‍යවරයන් පුහුණු කිරීම සඳහා පිහිටුවා පවත්වාගෙන යනු ලබන යම් ආයතනයකට ;

(ඇ) 8 වෙනි වගන්තියෙහි සඳහන් යම් ආයතනයකට ;

(ඈ) ආයුර්වේදය දියුණු කිරීම සඳහා පිහිටුවා පවත්වාගෙන යනු ලබන වෙන යම් ආයතනයකට ; හා

(ඉ) ආයුර්වේද අධ්‍යාපන කටයුතු කර ගෙන යාම සඳහා යම් සුදුසු තැනැත්තකුට ද

ප්‍රදානය කළ හැකි ය.

ආයුර්වේද ආරෝග්‍යශාලා ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා ලියාපදිංචි කළ යුතු බව.

10. (1) යම් ස්ථානයක් දැනට ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ, ඒ ස්ථානයෙහි ඒ ආරෝග්‍යශාලාව, ඖෂධ නිෂ්පාදනාගාරය, ඖෂධශාලාව හෝ බෙහෙත් ගබඩාව පවත්වාගෙන යනු ලබන තැනැත්තා එවකට එහි අයිතිකරු වශයෙන් ද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබුවහොත් මිස, ඇමතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් නියම කළ හැකි දිනයක පටන් හා ඊට පසු ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් සඳහා කිසි ම ස්ථානයක් පරිහරණය නො කළ යුතු ය.

(2) (1) වෙනි උපවගන්තිය යටතෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවෙන් නියමිත දිනය ඒ ආඥාව ප්‍රසිද්ධ කිරීමේ දිනයට පසු තුන් මාසයකට මෙ පිට දිනයක් නො විය යුතු ය.

(3) (1) වෙනි උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරමින් ආයුර්වේද ආරෝග්‍යශාලාවක, ඖෂධ නිෂ්පාදනාගාරයක, ආයුර්වේද ඖෂධශාලාවක හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක කාර්‍යය සඳහා

1 *—ආර් 5220 (62/10)

මසාරිස්
ා විසින්
ර්වේද
ර්ගාශාලා
ා පිහිටුවීම
පවත්වාගෙන

මසාරිස්
ා විසින්
ා ලබන
ී ආධාර.

යම් ස්ථාන පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ඒ ආරෝග්‍යශාලාව, ඖෂධ නිෂ්පාදනාගාරය, ඖෂධශාලාව හෝ බෙහෙත් ගබඩාව එවකට භාර ව සිටින තැනැත්තා වරදක් සම්බන්ධයෙන් වරදකරු විය යුතු ය.

(4) පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් මේ පනත යටතෙහි නියෝග සම්පාදනය කළ හැකි ය.

එනම් :—

(අ) ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් වශයෙන් යම් ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම;

(ආ) ඒ ඉල්ලීම්වල ආකෘතිය හා එහි අන්තර්ගත විය යුතු විස්තර;

(ඇ) එසේ ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තුව;

(ඈ) ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතු කාලසීමාව හා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු ඒ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සම්බන්ධ සහතික ප්‍රදානය කිරීම;

(ඉ) ඒ ලියාපදිංචි කිරීම අවලංගු හෝ ප්‍රතික්ෂෙප කළ හැකි අවස්ථා;

(ඊ) ඒ ලියාපදිංචි කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂෙප කළ හැකි අවස්ථා;

(උ) ඒ ලියාපදිංචි කිරීම සඳහා හෝ ඒ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් ප්‍රතික්ෂෙප කිරීමට විරුඬ ව හෝ ඒ ලියාපදිංචි කිරීම අවලංගු කිරීමට විරුඬ ව ඇමතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආයාචන හා ඒ ආයාචන සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් කරනු ලැබූ තීරණවල අවසාන භාවය;

(ඌ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා සම්බන්ධයෙන් ඉෂ්ට කළ යුතු කොන්දේසි;

(එ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩාවල තබාගෙන පවත්වාගෙන යා යුතු වාර්තා හා පොත්;

(ඒ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා සම්බන්ධයෙන් කලින් කලට සැපයිය යුතු වාර්තා හා ඇතුළු කර ගනු ලැබූ හෝ ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් හා එහි සේවයෙහි යෙදුණු සේවක මණ්ඩලය සම්බන්ධ විස්තර ඇතුළු එහි සඳහන් විය යුතු විස්තර;

ුර්වේද
රෝග්‍යශාලා
ෂධ නිෂ්
නාගාර,
ෂධශාලා හා
ෙහෙත් ගබඩා
ාපදිංචි කළ
ු බව.

(ඔ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා මගින් අයකර ගත හැකි ගාස්තු හෝ අය කිරීම සම්බන්ධ ගණන් ;

(ඕ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩාවලට ඇතුළුවීම හා පරීක්ෂා කිරීම සම්බන්ධ බලතල ;

(ක) ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා ලියාපදිංචි කිරීමේ කාර්ය්‍ය සඳහා කොමසාරිස්වරයා විසින් තැබිය යුතු හා පවත්වාගෙන යා යුතු ලේඛන ; හා

(ග) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා නිසියාකාර පවත්වාගෙන යාම හා පරිපාලනය හා ඒ ආරෝග්‍යශාලා හා ඖෂධශාලාවල ප්‍රතිකාර කරනු ලබන තැනැත්තන්ගේ සෞඛ්‍යය ආරක්ෂාව හා ඔවුනට නිසියාකාර සැලකීම හා ප්‍රතිකාර කිරීම ;

## III වෙනි කොටස

### ආයුර්වේද වෛද්‍ය සභාව

ආයුර්වේද වෛද්‍ය සභාව සංස්ථාපනය කිරීම.

**11.** (1) මේ කොටසෙහි මින්මතු "සභාව" වශයෙන් හඳුන්වනු ලබන, ආයුර්වේද වෛද්‍ය සභාව නමින් හැඳින්විය යුතු සභාවක් විය යුතු ය. 2 වෙනි උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) කොමසාරිස්වරයා ;

(ආ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි විද්‍යාලයාධිපති ;

(ඇ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි ආචාර්ය්‍යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් දෙදෙනකු ;

(ඈ) අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්ය්‍යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කරගනු ලැබූ එක් සාමාජිකයකු ;

(ඉ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් තුන් දෙනකු ; හා

(ඊ) ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් දස දෙනකුට වැඩි නො වන ගණනක්. ඔවුන් අතර,

(i) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් නො වන තැනැත්තන් අතරෙන් තුන් දෙනකුට වැඩිය මෙ සේ පත් නො කළ යුතුය.

(ii) සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය විසින් නම් කෙරෙන දස දෙනකුගෙන් යුත් මණ්ඩලයකින් යටත් පිරිසෙයින් තුන් දෙනකු එ සේ පත් කරනු ලැබිය යුතු ය.

(iii) සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනයේ සාමාජිකයන් නො වන ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන්ගෙන් යටත් පිරිසෙයින් දෙ දෙනකු එ සේ පත් කරනු ලැබිය යුතු ය.

(2). ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සභාවෙහි යම් සාමාජිකයකු, තමන් විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් කිසි ම හේතුවක් නො දී, නිලයෙන් පහ කළ හැකි ය.

(3) ඇමතිවරයා විසින් නිලයෙන් පහ කරනු ලැබූ සභාවෙහි යම් සාමාජිකයකු, ඔහු පහ කරනු ලැබූ දිනයෙහි පටන් අවුරුදු තුනක කාලයක් සඳහා එ බඳු සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ තෝරා පත් කර ගැනීමට නුසුදුසු විය යුතු ය.

(4) සභාවෙහි සාමාජිකයන්ගෙන් සමන්විත කාරක සභාවකට හෝ සභාවලට සභාවෙහි යම් බලයක්, යුතුකමක් හෝ කාර්‍යයක් සභාව විසින් කලින් කලට නියෝජනය කළ හැකි ය. සභාව විසින් අවශ්‍ය ය යි සලකනු ලබන කොන්දේසි හා සීමා කිරීම්වලට එ බඳු යම් නියෝජනයක් යටත් විය හැකි ය.

*සභාවෙහි සාමාජිකයන්ගේ නිල කාලය.*

12. කොමසාරිස්වරයා හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හැර, සභාවෙහි එක් එක් සමාජිකයකු, තමන් විසින් කලින් නිලයෙන් අස් නො වුවහොත්, අවුරුදු තුනක කාලයක් සේවය කළ යුතු අතර නැවත තෝරා ගැනීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

එ සේ වුව ද, සභාවෙහි තමාගේ සේවා කාලය ගෙවී යාමට පෙර සාමාජිකත්වය හැර ගිය යම් තැනැත්තකුට අනුප්‍රාප්තික ව සභාවෙහි සාමාජිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ තැනැත්තකු තමා විසින් කලින් නිලයෙන් අස් නො වුවහොත්, ඔහු අනුප්‍රාප්තික වශයෙන් පත් වූ සාමාජිකයාගේ නොගෙවී ගිය නිල කාලය සඳහා සේවය කළ යුතු ය.

*සභාවෙහි සාමාජිකයන් විසින් නිලය අත් හැරීම.*

13. (1) කොමසාරිස්වරයා හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හැර, සභාවෙහි සාමාජිකයකු—

(අ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, තමාගේ ඉල්ලා අස්වීම ලියවිල්ලකින් සභාවෙහි සභාපති වෙත ඉදිරිපත් කිරීමෙන් ;

(ආ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, සභාවෙහි මතය අනු ව සෑහෙන හේතුවක් නොමැති ව සභාවෙහි අනුක්‍රමික රැස්වීම් තුනකට නො පැමිණ සිටීමෙන් ;

(ඇ) ඔහු 11 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතෙහි තෝරා ගනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, සභාවෙහි සාමාජිකයකු වශයෙන් තෝරා ගැනීමට ඔහු සුදුස්සකු කරනු ලැබූ බලය වූ තනතුර හෝ තිලය ඔහු විසින් අත්හැරීමෙන් ;

(ඈ) ඔහු පත් කරනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, ඇමති වරයා විසින් ඔහු තිලයෙන් පහ කිරීමෙන් ;

(ඉ) ඔහු ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු වීම නතරවීමෙන් හෝ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ඔහු ගේ ලියාපදිංචි කිරීම අත්හිටවමින් සභාව විසින් මේ පනත යටතෙහි කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක වීමෙන් ;

(ඊ) දණ්ඩ නීති සංග්‍රහය යටතෙහි යම් වරදක් සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබීමෙන් ; හෝ

(උ) ඔහුගේ තිල කාලය ඉකුත් වීමෙන් ;

තිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(2) කොමසාරිස්වරයා වශයෙන් තිලය දැරීම නතර වීමෙන් පසු, සභාවෙහි සාමාජිකයකු වශයෙන් කොමසාරිස්වරයා තිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(3) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති වශයෙන් තිලය දැරීම නතර වීමෙන් පසු, සභාවෙහි සාමාජිකයකු වශයෙන් ආයුර් වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති තිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

*පුරප්පාඩු පිරවීම.*

14. සභාවෙහි යම් පුරප්පාඩුවක්, මේ කොටසෙහි විධිවිධාන අනු ව අවස්ථෝචිත පරිදි, සාමාජිකයකු තෝරා ගැනීමෙන් හෝ පත් කිරීමෙන් පිරවිය යුතු ය.

*සභාවෙහි සභාපති හා උප සභාපති*

15. (1) කොමසාරිස්වරයා සභාවෙහි සභාපති විය යුතු ය. (2) සභාවෙහි සාමාජිකයන් විසින් ඔවුන් අතරෙන් සභාවෙහි උප සභාපතිවරයකු තෝරා ගත යුතු ය.

(3) සභාවෙහි සභාපතිවරයා ද, ඔහු නො පැමිණි අවස්ථාවක උප සභාපතිවරයා ද සභාවෙහි යම් රැස්වීමක මූලාසනය දැරිය යුතු ය. සභාවෙහි සභාපතිවරයා හෝ උපසභාපතිවරයා සභාවෙහි යම් රැස්වීම කට නො පැමිණි අවස්ථාවක, ඒ රැස්වීමට සහභාගී වන සභාවෙහි සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා ඔවුන් අතරෙන් සභාපති වරයකු තෝරා ගත යුතු ය.

*ගණපූරණය.*

16. සභාවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය හය දෙනකු විය යුතු ය.

20. (1) සභාවෙහි වර්තමාන සාමාජිකයන් "ආයුර්වේද වෛද්‍ය සභාව" යන නම දරන නීතිගත සංස්ථාවක් විය යුතු අතර එය අවිච්ඡින්න පත් කිරීම්වලින් ද යුක්ත විය යුතු ය. ඒ මණ්ඩලය විසින් ඒ නමින් නඩු පැවරිය හැකි අතර නඩු පවරනු ලැබිය හැකි ද වෙයි. තවද අධිකරණ මගින් පිළිගත යුතු නීතිගත මුද්‍රාවක් යොදා ගත හැකි ය; වෙනස් කළ හැකි ය; පරිහරණය කළ හැකි ය; සභා [illegible]

(2) සභාව විසින් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගෙන අයිතියේ තබා ගත හැකි ය. ස්වකීය දේපළවලින් යම් දේපළක් සම්බන්ධයෙන් සුදුස්සක් ද කළ හැකි අතර ගිවිසුම්වලට ද ඇතුළු විය හැකි ය. ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා හා ස්වකීය කටයුතු හෝ යුතුකම් ඉෂ්ට කිරීම සඳහා ද අවශ්‍ය විය හැකි වෙන යම් කටයුතු සියල්ල ද කළ හැකි ය.

21. (1) කලින් කලට— සභාවෙහි අරමුදල්.

(අ) සභාවෙහි කාර්යයන් සඳහා කොමසාරිස්වරයා විසින් මේ පනත යටතෙහි ප්‍රදානය කළ හැකි, හෝ

(ආ) එම් පනත යටතෙහි ගාස්තු වශයෙන් සභාවට ගෙවනු ලැබිය හැකි හෝ සභාව විසින් අය කර ගත හැකි,

මුදල් සභාවෙහි අරමුදල්වලින් කොටසක් විය යුතු ය.

(2) සභාවෙහි අරමුදල්වලින්—

(අ) රැස්වීම්වලට සහභාගිවීම සම්බන්ධයෙන් 45 වෙනි වගන්තියෙහි සභාවෙහි සාමාජිකයන්ගට ගෙවිය යුතු වූ ද, සභාවෙහි නිලධරයන්ගට හා සේවකයන්ගට ගෙවිය යුතු වූ ද ගෙවීම්, හා

(ආ) සභාව විසින් මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී හා ස්වකීය කටයුතු හා යුතුකම් ඉෂ්ට කිරීමේ දී දරන්නට සිදු වූ වෙනත් සියලු ම වියදම් ද ගෙවිය යුතු ය.

## IV වෙනි කොටස

## ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩල

22. (1) මින් මතු මේ කොටසෙහි "මණ්ඩලය" වශයෙන් හඳුන්වනු ලබන ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය නමින් හැඳින්විය යුතු මණ්ඩලයක් විය යුතු ය. එය පහත සඳහන් සාමාජික යන්ගෙන් සමන්විත විය යුතු ය:— ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය.

(අ) කොමසාරිස්වරයා;

(ආ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති;

(ඇ) ආයුර්වේද මහාආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී;

සභාවෙහි කාර්ය පටිපාටිය විධිමත් කිරීම.

17. 15 වෙනි වගන්තියෙහි, 16 වෙනි වගන්තියෙහි හා 44 වෙනි වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත් ව, සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද ඖෂධ සංයෝගකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන් ලියාපදිංචි කිරීම ද ඔවුන්ගේ වෘත්තීය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම ද සම්බන්ධයෙන් සභාව වග කිය යුතු බලමණ්ඩලය විය යුතු බව.

18. මේ පනතෙහි විධිවිධාන අනුව සභාව—

(අ) ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතෙහි කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතු ද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම;

(ආ) ආයුර්වේද වෛද්‍යවරයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම;

(ඇ) ආයුර්වේද ඖෂධ සංයෝගකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම;

(ඈ) ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම;

(ඉ) එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටවීම; හා

(ඊ) (i) ආයුර්වේද වෛද්‍යවරයන්ගේ, ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ හා ආයුර්වේද සාත්තු සේවකයන්ගේ වෘත්තීය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා ද

(ii) මේ වගන්තියෙහි (ආ) සිට (ඉ) තෙක් ඡේදවල සඳහන් කරුණුවලින් යමක් සඳහා ද ව්‍යවස්ථා සම්පාදනය කිරීම;

සම්බන්ධයෙන් වග කිය යුතු බලමණ්ඩලය විය යුතු ය.

සභාවෙහි ලේඛකාධිකාරී හා වෙනත් නිලධාරී හා සේවකයෝ.

19. (1) සභාව විසින්—

(අ) සභාවෙහි ලේකම් වශයෙන් ද කටයුතු කළ යුතු, සභාවෙහි ලේඛකාධිකාරිවරයකු පත් කළ යුතු ය;

(ආ) තවද, සභාවෙහි කටයුතු කිරීමට අවශ්‍ය විය හැකි සභාවේ වෙනත් නිලධරයන් හා සේවකයන් ද පත් කළ හැකි ය.

(2) සභාවෙහි නිලධරයන්හට හා සේවකයන්හට මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථා අනුව නිශ්චය කරනු ලබන අන්දමට හා එබඳු ගණන් අනු ව වේතන ගෙවිය යුතු ය. එබඳු සේවා කොන්දේසිවලට ද ඔවුන් යටත් විය යුතු ය.

(3) මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථා අනු ව සභාව විසින් එහි නිලධරයන්ගේ හා සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවා විධිමත් කිරීම හා සභාවෙහි අරමුදල්වලින් ඒ අරමුදලට දායක මුදල් ගෙවීම කළ හැකි ය.

20. (1) සභාවෙහි වර්තමාන සාමාජිකයන් "ආයුර්වේද වෛද්‍ය සභාව" යන නම දරන නීතිගත සංස්ථාවක් විය යුතු අතර එය අඛණ්ඩ පැවැත්මකින් හා පොදු මුද්‍රාවකින් ද යුක්ත විය යුතු ය. ඒ මණ්ඩලය විසින් ඒ නමින් නඩු පැවරිය හැකි අතර නඩු පවරනු ලැබිය හැකි ද වෙයි. තවද අධිකරණ මගින් පිළිගත යුතු නීතිගත මුද්‍රාවක් යොදා ගත හැකි ය; වෙනස් කළ හැකි ය; පරිහරණය කළ හැකි ය; (සභා සංස්ථාපනය)

(2) සභාව විසින් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගෙන අයිතියේ තබා ගත හැකි ය. ස්වකීය දේපළවලින් යම් දේපළක් සම්බන්ධයෙන් සුදුසක් ද කළ හැකි අතර ගිවිසුම්වලට ද ඇතුළු විය හැකි ය. ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා හා ස්වකීය කටයුතු හෝ යුතුකම් ඉෂ්ට කිරීම සඳහා ද අවශ්‍ය විය හැකි වෙනත් යම් කටයුතු සියල්ල ද කළ හැකි ය.

21. (1) කලින් කලට— (සභාවෙහි අරමුදල්.)

(අ) සභාවෙහි කාර්යයන් සඳහා කොමසාරිස්වරයා විසින් මේ පනත යටතෙහි ප්‍රදානය කළ හැකි, හෝ

(ආ) මේ පනත යටතෙහි ගාස්තු වශයෙන් සභාවට ගෙවනු ලැබිය හැකි හෝ සභාව විසින් අය කර ගත හැකි,

මුදල් සභාවෙහි අරමුදල්වලින් කොටසක් විය යුතු ය.

(2) සභාවෙහි අරමුදල්වලින්—

(අ) රැස්වීම්වලට සහභාගිවීම සම්බන්ධයෙන් 45 වෙනි වගන්තියෙහි සභාවෙහි සාමාජිකයන්හට ගෙවිය යුතු වූ ද, සභාවෙහි නිලධරයන්හට හා සේවකයන්හට ගෙවිය යුතු වූ ද ගෙවීම්, හා

(ආ) සභාව විසින් මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී හා ස්වකීය කටයුතු හා යුතුකම් ඉෂ්ට කිරීමේ දී දරන්නට සිදු වූ වෙනත් සියලු ම වියදම් ද ගෙවිය යුතු ය.

## IV වෙනි කොටස

### ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩල

22. (1) මින්මතු මේ කොටසෙහි "මණ්ඩලය" වශයෙන් හඳුන්වනු ලබන ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය නමින් හැඳින්විය යුතු මණ්ඩලයක් විය යුතු ය. එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— (ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය.)

(අ) කොමසාරිස්වරයා;

(ආ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති;

(ඇ) ආයුර්වේද මහාආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී;

(ඈ) අධ්‍යාපන ඇමතිවරයාගේ නිර්දේශය පිට ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ඉ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ආචාර්යවරුන් අතරෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ එක් සාමාජිකයෙකු;

(ඊ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ආචාර්යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා ගනු ලැබූ සාමාජිකයන් දෙ දෙනෙකු;

(උ) අනුමත කරනු ලැබූ ආයුර්වේද අධ්‍යයන ආයතනයන්හි ආචාර්යවරුන් අතරෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ එක් සාමාජිකයකු;

(ඌ) ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය හෝ ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ අභිඥාන පත්‍ර දරන්නන් විසින් ඔවුන් අතරෙන් තෝරා ගනු ලැබූ සාමාජිකයන් දෙ දෙනකු;

(එ) සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය විසින් නම් කෙරෙන හය දෙනකුගෙන් යුත් මණ්ඩලයකින් දෙ දෙනකුට නො වැඩි වන ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන් අතරෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් සතර දෙනකුට වැඩි නො වන ගණනක්, හා

(ඒ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන් නො වන තැනැත්තන්ගෙන්, ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් දෙ දෙනකු,

(2) ඇමතිවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, තමන් විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් කිසි ම හේතුවක් නො දී නිලයෙන් පහ කළ හැකි ය.

එ සේ වුව ද, අධ්‍යාපන ඇමතිවරයාගේ නිර්දේශය පිට ඇමතිවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලැබූ කිසි ම සාමාජිකයකු අධ්‍යාපන ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව මිස, නිලයෙන් පහ නො කළ යුතු ය.

(3) ඇමතිවරයා විසින් නිලයෙන් පහ කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඔහු අස් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා එ වැනි සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ තෝරා ගනු ලැබීමට සුදුසු නො විය යුතු ය.

සභාවෙහි සාමාජිකයන්ගේ නිල කාලය.

23. කොමසාරිස්වරයා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හා ප්‍රධාන අයුර්වේද අරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී හැර මණ්ඩලයෙහි එක් එක් සාමාජිකයකු තමන් විසින් කලින් නිලයෙන් අස් නොවුවහොත්, අවුරුදු තුනක කාලයක් සේවය කළ යුතු අතර තවද නැවත තෝරා ගැනීමට හෝ නැවත පත් කර ගැනීමට සුදුස්සකු ද විය යුතු ය.

එසේ වුව ද මණ්ඩලයෙහි තමාගේ නිල කාලය ගෙවී යාමට පෙර සාමාජිකත්වය හැර ගිය යම් තැනැත්තකුට අනුප්‍රාප්තික ව මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් තෝරා ගනු ලැබූ හෝ පත්

කරනු ලැබූ තැනැත්තකු තමා විසින් කලින් නිලයෙන් අස් නො වුවහොත්, ඔහු අනුප්‍රාප්තික වශයෙන් පත් වූ සාමාජිකයාගේ නො ගෙවී ගිය නිල කාලය සඳහා සේවය කළ යුතු ය.

මණ්ඩලයෙහි සාමාජිකයන් විසින් නිලය අත් හැරීම.

24. (1) කොමසාරිස්වරයා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හා ආයුර්වේද මහාරෝගයශාලාවේ වෛද්‍ය අධිකාරි හැර, මණ්ඩලයෙහි සාමාජිකයකු—

(අ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, තමාගේ ඉල්ලා අස්වීම ලියවිල්ලකින් මණ්ඩලයෙහි සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් ; හෝ

(ආ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, මණ්ඩලයෙහි මතය අනු ව සෑහෙන හේතුවක් නොමැති ව මණ්ඩලයෙහි අනුක්‍රමික රැස්වීම් තුනකට නො පැමිණ සිටීමෙන් ;

(ඇ) ඔහු තෝරා ගනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් තෝරා ගැනීමට ඔහු සුදුස්සකු කරනු ලැබූ බලය වූ තනතුර හෝ නිලය ඔහු දැරීම නතරවීමෙන් ;

(ඈ) ඔහු පත් කරනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, ඇමතිවරයා විසින් ඔහු නිලයෙන් පහ කිරීමෙන් ;

(ඉ) ඔහු 22 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි (ඈ) ඡේදය යටතෙහි පත් කරනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, ඔහු විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයකු වීම නතර වීමෙන් ;

(ඊ) ඔහු 22 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතෙහි පත් කරනු ලැබූ සාමාජිකයකු වූ අවස්ථාවක, ඒ ඡේදය යටතෙහි මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් පත් කර ගැනීමට ඔහු සුදුස්සකු කරනු ලැබූ බලය වූ තනතුර හෝ නිලය ඔහු දැරීම නතර වීමෙන් ; හෝ

(උ) ඔහුගේ නිල කාලය ඉකුත්වීමෙන්, නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(2) කොමසාරිස්, නිලය දැරීම නතරවීමෙන් පසු, මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් කොමසාරිස්වරයා නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(3) ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති, නිලය දැරීම නතර වීමෙන් පසු, මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(4) ආයුර්වේද මහා රෝගයශාලාවේ වෛද්‍ය අධිකාරී නිලය දැරීම නතර වීමෙන් පසු, මණ්ඩලයෙහි සාමාජිකයකු වශයෙන් ආයුර්වේද මහාරෝගයශාලාවේ වෛද්‍ය අධිකාරී නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

පුරප්පාඩු පිරවීම.

25. මණ්ඩලයෙහි යම් පුරප්පාඩුවක් මේ කොටසේ විධිවිධාන අනු ව අවස්ථාවෝචිත පරිදි සාමාජිකයකු තෝරා ගැනීමෙන් හෝ පත් කිරීමෙන් පිරවිය යුතු ය.

මණ්ඩලයෙහි සභාපති.

26. (1) කොමසාරිස්වරයා මණ්ඩලයෙහි සභාපති විය යුතු ය.

(2) මණ්ඩලයෙහි සභාපතිවරයා මණ්ඩලයෙහි යම් රැස්වීමක මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයෙහි යම් රැස්වීමකට සභාපතිවරයා නො පැමිණි අවස්ථාවක, ඒ රැස්වීමට සහභාගි වන මණ්ඩලයෙහි සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා ඔවුන් අතරෙන් සභාපති වරයකු තෝරා ගත යුතු ය.

ගණපූරණය.

27. මණ්ඩලයෙහි රැස්වීමක් සඳහා ගණපූරණය හය දෙනකු විය යුතු ය.

මණ්ඩලයෙහි කාර්ය පටිපාටිය විධිමත් කිරීම.

28. 26 වෙනි වගන්තියෙහි, 27 වෙනි වගන්තියෙහි හා 44 වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ යුතු ය.

මණ්ඩලයෙහි බලතල, කටයුතු හෝ යුතුකම් කාරක සභාවලට පැවරීම

29. මණ්ඩලයෙහි යම් බලතල, කටයුතු හෝ යුතුකම් මණ්ඩලයෙහි සාමාජිකයන්ගෙන් සමන්විත වූ කාරක සභාවකට හෝ කාරක සභාවලට හෝ මණ්ඩලය විසින් කලින් කලට පැවරිය හැකි ය. මණ්ඩලයට සුදුසු ය යි හැඟෙන කොන්දේසිවලට හෝ සීමාවලට යටත් ව එවැනි යම් පැවරීමක් කළ හැකි ය.

මණ්ඩලයෙහි බලතල.

30. පහත සඳහන් දේ සඳහා මණ්ඩලයට බලතල තිබිය යුතු ය :—

(අ) මේ කොටසේ මින්මතු "විද්‍යාලය" වශයෙන් හඳුන්වනු ලබන ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ඇතුළු කර ගනු ලැබූ ශිෂ්‍යයන්හට දිය යුතු අධ්‍යයන පද්ධති නිශ්චය කිරීම ;

(ආ) විද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා පරීක්ෂණ නිශ්චය කිරීම හා පැවැත්වීම ;

(ඇ) සභාව විසින් ප්‍රදානය කළ යුතු අභිඥාන පත්‍ර හා එවැනි අභිඥාන පත්‍ර ප්‍රදානය කිරීමට සුදුසුවීම සඳහා සම්පූර්ණ කළ යුතු කොන්දේසි නිශ්චය කිරීම ;

(ඈ) විද්‍යාලයේ ශිෂ්‍යයන් නො වූ තැනැත්තන්හට සභාවෙහි අභිඥාන පත්‍ර ලබා ගැනීමට බාහිර පරීක්ෂණ නිශ්චය කිරීම හා පැවැත්වීම, හා ඒ කාර්යය සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය කිරීම ;

(ඉ) විද්‍යාලයේ ශිෂ්‍යයන්හට ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග පිහිටුවීම හා පිරිනැමීම ;

(ඊ) විද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළු කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම ;

(ඊ) විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ වාසය, විනය හා ඔවුන්ගේ සදාචාර, මානසික හා කායික ශුභ සිද්ධිය විධිමත් කිරීම ;

(උ) සභාව මගින් පවත්වනු ලබන පරීක්ෂණ සඳහා පරීක්ෂක යන් පත් කිරීම ;

(ඌ) එ වැනි පරීක්ෂකයන් සඳහා ගෙවිය යුතු ගාස්තු සම්බන්ධ යෙන් ඇමතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(එ) විද්‍යාලයේ පරිපාලනය සම්බන්ධයෙන් ද, විශේෂයෙන් විද්‍යාලයට ඇතුළුවීම සඳහා අය කළ යුතු ගාස්තු සම්බන්ධ යෙන් ද ඇමතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඒ) සම්මාන අභිඥාන පත්‍ර හෝ උපාධි ප්‍රදානය කිරීම ; හා

(ඔ) ආයුර්වේද මහාරෝගයශාලාවේ පරිපාලනය සම්බන්ධයෙන් ද, විශේෂයෙන් එම ආරෝගයශාලාවට ඇතුළු කර ගනු ලැබූ රෝගීන් සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු සම්බන්ධ යෙන් ද ඇමතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

31. විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයකු පත් කළ යුතු ය. ඔහු මණ්ඩලයෙහි ලේකම්වරයා වශයෙන් ද කටයුතු කළ යුතු ය. විද්‍යාලයේ ලේඛකාධිකාරී.

32. මණ්ඩලයෙහි රැස්වීම්වලට සහභාගිවීම සම්බන්ධයෙන් මණ්ඩලයෙහි සාමාජිකයන්හට 45 වෙනි වගන්තිය යටතෙහි ගෙවිය යුතු දීමනා ද, මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී හා ස්වකීය කටයුතු හා යුතුකම් ඉටු කිරීමේ දී මණ්ඩලයට දරන්නට සිදු වූ වෙනත් සියලු වියදම් ද පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා සම්මත කරනු ලැබූ මුදල්වලින් ගෙවිය යුතු ය. මණ්ඩලයෙහි වියදම්.

## V වෙනි කොටස

### ආයුර්වේද පර්යේෂණ කාරක සභාව

33. (1) මේ කොටසේ මින්මතු "කාරක සභාව" වශයෙන් හඳුන්වනු ලබන, ආයුර්වේද පර්යේෂණ කාරක සභාව යන නමින් හැඳින්විය යුතු කාරක සභාවක් විය යුතු ය. එය කොමසාරිස්වරයා-ගෙන් හා ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ වෙනත් සාමාජිකයන් නම දෙනකුගෙන් සමන්විත විය යුතු ය. ඔවුන්ගෙන් එක් කෙනකු ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයෙන් හා තවත් කෙනකු ආයුර්වේද මහාරෝගයශාලාවේ නිත්‍ය වෛද්‍ය මණ්ඩලයෙන් විය යුතු ය. ආයුර්වේද පර්යේෂණ කාරක සභාව සංස්ථාපනය කිරීම.

(2) ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ කාරක සභාවෙහි යම් සාමාජිකයකු, තමන් විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින්, කිසි ම හේතුවක් නො දී, ධුරයෙන් පහ කළ හැකි ය.

කාරක සභාවෙහි සාමාජිකයන්ගේ නිල කාලය.

34. කොමසාරිස්වරයා හැර කාරක සභාවෙහි එක් එක් සාමාජිකයකු තමන් විසින් කලින් නිලයෙන් අස් නො වුවහොත්, අවුරුදු තුනක කාලයක් නිලය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීමට ද සුදුසු විය යුතු ය.

එ සේ වුව ද, කාරක සභාවෙහි තමාගේ නිල කාලය ගෙවී යාමට පෙර සාමාජිකත්වය හැර ගිය යම් තැනැත්තකුට අනුප්‍රාප්තික ව කාරක සභාවෙහි සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තකු, තමා විසින් කලින් නිලයෙන් අස් නො වුවහොත්, ඔහු අනුප්‍රාප්තික වශයෙන් පත් වූ සාමාජිකයාගේ නො ගෙවී ගිය නිල කාලය සඳහා සේවය කළ යුතු ය.

කාරක සභාවෙහි සාමාජිකයන් විසින් නිලය අත් හැරීම.

35. (1) කොමසාරිස්වරයා හැර, කාරක සභාවෙහි සාමාජිකයකු—

(අ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, තමාගේ ඉල්ලා අස්වීම ලියවිල්ලකින් ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් ;

(ආ) ඔහු රජයේ සේවකයකු නො වන අවස්ථාවක, කාරක සභාවෙහි මතය අනු ව සෑහෙන හේතුවක් නොමැති ව කාරක සභාවෙහි අනුක්‍රමික රැස්වීම් තුනකට නො පැමිණ සිටීමෙන් ;

(ඇ) ඇමතිවරයා විසින් ඔහු නිලයෙන් පහ කිරීමෙන් ; හෝ

(ඈ) ඔහුගේ නිල කාලය ඉකුත්වීමෙන්,

නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

(2) කොමසාරිස්වරයා නිලය දැරීම නතරවීමෙන් පසු, කාරක සභාවෙහි සාමාජිකයකු වශයෙන් කොමසාරිස්වරයා නිලයෙන් අස් වූ ලෙස සැලකිය යුතු ය.

පුරප්පාඩු පිරවීම.

36. කාරක සභාවෙහි යම් පුරප්පාඩුවක්, මේ කොටසෙහි විධිවිධාන අනු ව සාමාජිකයකු පත් කිරීමෙන් පිරවිය යුතු ය.

කාරක සභාවෙහි සභාපති.

37. (1) කොමසාරිස්වරයා කාරක සභාවෙහි සභාපති විය යුතු ය.

(2) කාරක සභාවෙහි යම් රැස්වීමක කාරක සභාවෙහි සභාපතිවරයා විසින් මූලසුන දැරිය යුතු ය. කාරක සභාවෙහි යම් රැස්වීමකට සභාපතිවරයා නො පැමිණි අවස්ථාවක, ඒ රැස්වීමට සහභාගි වන කාරක සභාවෙහි සාමාජිකයන් විසින් ඔවුන් අතරෙන් ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරා ගත යුතු ය.

ගණපූරණය.

38. කාරක සභාවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය තුන් දෙනකු විය යුතු ය.

කාරක සභාවෙහි කාර්ය පටිපාටිය විධිමත් කිරීම.

39. 37 වෙනි වගන්තියෙහි, 38 වෙනි වගන්තියෙහි හා 44 වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත් ව කාරක සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ යුතුය.

**40.** කාරක සභාවෙහි රැස්වීම්වලට සහභාගිවීම සම්බන්ධයෙන් 45 වෙනි වගන්තිය යටතෙහි කාරක සභාවෙහි සාමාජිකයන් හට ගෙවිය යුතු දීමනා හා මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී හා ස්වකීය කටයුතු හා යුතුකම් ඉෂ්ට කිරීමේ දී කාරක සභාව විසින් දරන්නට සිදු වූ වෙනත් සියලු වියදම් ද ඒ කාර්‍යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබූ මුදල්වලින් ගෙවිය යුතු ය. කාරක සභාවේ වියදම්.

**41.** (1) ආයුර්වේද සංවර්ධනය, දියුණු කිරීමේ අදහසින් ආයුර්වේදයෙහි සියලු ම අංශවල පර්යේෂණ කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් ද විශේෂයෙන් පහත සඳහන් එනම්:— කාරක සභාවේ යුතුකම්.

(අ) ආයුර්වේද සාහිත්‍යය ;

(ආ) ආයුර්වේද ශාස්ත්‍රයෙහි මූලධර්ම ;

(ඇ) ආයුර්වේද චිකිත්සාගාරික ප්‍රතිකර්ම ; හා

(ඈ) ආයුර්වේද ඖෂධ, ඖෂධ ශාස්ත්‍රය හා ඖෂධ සංග්‍රහය, යන කරුණු පිළිබඳ පර්යේෂණ කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් ද ඇමතිවරයාට උපදෙස් දීම කාරක සභාවෙහි යුතුකම විය යුතු ය.

(2) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් කාරක සභාවට නිකුත් කළ හැකි සියලු නියමයන් ඉෂ්ට කිරීම කාරක සභාවෙහි යුතුකම විය යුතු ය:—

(අ) පුස්තකාල, කෞතුකාගාර, ඖෂධ නිධි, රසායනාගාර හා වෙනත් ආයතන පවත්වාගෙන යාම ;

(ආ) ආයුර්වේද අත් පිටපත්, ආයුර්වේද ග්‍රන්ථ හා වෙනත් ආයුර්වේද සඟරා හෝ පත්‍ර ප්‍රකාශ කිරීම ;

(ඇ) ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම ;

(ඈ) ආයුර්වේද ඖෂධ ප්‍රමිත කිරීම ;

(ඉ) (1) වෙනි උපවගන්තියෙහි නියමිත යුතුකම් ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය විය හැකි එ බඳු වෙනත් සියලු කරුණු.

## VI වෙනි කොටස

### මේ පනත යටතෙහි පිහිටුවනු ලැබූ පුද්ගල මණ්ඩලවලට අදාළවන විශෙෂ විධිවිධාන

**42.** මේ කොටසෙහි පද සංසන්දනයෙන් වෙනස් අර්ථයක් අවශ්‍ය නො වූ විටක "පුද්ගල මණ්ඩලය" යන පදයෙන්, මේ පනත යටතෙහි පිහිටුවනු ලැබූ යම් සභාවක්, මණ්ඩලයක් හෝ කාරක සභාවක් අදහස් වේ. මේ කොටසෙහි කාර්‍යයන් සඳහා "පුද්ගල මණ්ඩලය" යන පදයෙහි විස්තරය.

ඇමතිවරයාගේ සාමාන්‍ය හා විශේෂ නියම වලට පුද්ගල මණ්ඩලයක් යටත් විය යුතු බව.

43. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී හා ස්වකීය කටයුතු හා යුතුකම් ඉෂ්ට කිරීමේ දී ඇමතිවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හා විශේෂ නියමවලට යටත් විය යුතු ය.

යම් පුද්ගල මණ්ඩලයක කටයුතු.

44. (1) පුද්ගල මණ්ඩලයක් ඉදිරියේ සැලකිල්ලට ඉදිරිපත් වන සෑම ප්‍රශ්නයක් ම පුද්ගල මණ්ඩලයෙහි රැස්වීමක දී විසඳිය යුතු අතර පැමිණ ඡන්දය දෙන පුද්ගල මණ්ඩලයෙහි සාමාජිකයන් ගේ වැඩි ඡන්ද ගණනින් එය නිශ්චය කළ යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයෙහි රැස්වීමක දී සලකා බලනු ලැබූ යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සමාන ඡන්ද ගණනක් ලැබුණු අවස්ථාවක, ඒ රැස්වීමෙහි සභාපතිවරයාගේ සාමාන්‍ය ඡන්දයට අතිරේක වශයෙන් ඔහුට තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(3) පුද්ගල මණ්ඩලයෙහි යම් සාමාජිකයකු තෝරා ගැනීමෙහි හෝ පත් කිරීමෙහි යම් අඩුපාඩුවක් තිබුණු බව හෝ එ වැනි යම් සාමාජිකයකු නුසුදුසු බවට පත් වී සිටි බව පසු ව දැන ගත්තට ලැබුනේ වී නමුදු, සෑම සාමාජිකයකු ම නිසියාකාර තෝරා ගනු ලැබුවාක් මෙන් හෝ පත් කරනු ලැබුවාක් මෙන් ද, එ වැනි සාමාජිකයකු වීමට සුදුස්සකු වී සිටියාක් මෙන් ද, පුද්ගල මණ්ඩලයෙහි රැස්වීමක දී කරනු ලැබූ සියලු කටයුතු වලංගු විය යුතු ය.

(4) පුද්ගල මණ්ඩලයෙහි යම් පුරප්පාඩුවක් පමණක් හේතු කොට ගෙන පුද්ගල මණ්ඩලයෙහි කිසි ම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නො විය යුතු ය.

පුද්ගල මණ්ඩලයෙහි රැස්වීමකට පැමිණීම සම්බන්ධ ගෙවීම්.

45. මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා පුද්ගල මණ්ඩලයෙහි රැස්වීම්වලට පැමිණීම සම්බන්ධයෙන් පුද්ගල මණ්ඩලයෙහි සාමාජිකයන් හට ගෙවිය යුතු ය.

මේ පනත යටයෙහි හෝ පුද්ගල මණ්ඩලයක නියමය පිට කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

46. (අ) මේ පනත යටතෙහි පුද්ගල මණ්ඩලය විසින් සද්භාව යෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි හැඟවෙන යම් ක්‍රියාවක් ගැන පුද්ගල මණ්ඩලයකට විරුද්ධ ව ද;

(ආ) පුද්ගල මණ්ඩලයෙහි සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ පනත යටතෙහි හෝ පුද්ගල මණ්ඩල යෙහි නියමය පිට සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි හැඟ වෙන යම් ක්‍රියාවක් ගැන ඒ කිසිවකුට විරුද්ධ ව ද, කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

පුද්ගල මණ්ඩලයෙහි සාමාජිකයකුට හෝ ඔහුගේ දේපලවලට විරුද්ධව කිසි ආඥා පත්‍රයක් නිකුත් නො කළ යුතු බව.

47. පුද්ගල මණ්ඩලයට විරුද්ධ ව ගෙනෙනු ලැබූ යම් නඩුවක දී පුද්ගල මණ්ඩලයක සාමාජිකයකුට විරුද්ධ ව හෝ ඔහුගේ දේපළ වලට විරුද්ධ ව කිසි ම ආඥා පත්‍රයක් නිකුත් නො කළ යුතු ය.

48. 1954 අංක 11 දරන අල්ලස් පනතෙහි අර්ථය අනු ව පුද්ගල මණ්ඩලයක් උපලේඛනගත කරනු ලබූ ආයතනයක් වශයෙන් සැලකිය යුතු ය. තවද එහි විධිවිධාන යථා පරිදි පහදා ගත යුතු ය.

අල්ලස් පනතෙහි අර්ථය අනුව පුද්ගල මණ්ඩලයක් උපලේඛනගත කරනු ලැබූ ආයතනයක් වශයෙන් සැලකීම.

49. (1) පහත සඳහන් කරුණු සියල්ල හෝ එයින් යම් කරුණක්, සම්බන්ධයෙන් පුද්ගල මණ්ඩලයක් විසින් ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි ය.

ව්‍යවස්ථා සම්පාදනය කිරීම සම්බන්ධයෙන් පුද්ගල මණ්ඩලයක බලතල.

(අ) මේ පනතෙහි අන් කිසි විධිවිධානයක් යටතෙහි ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා පුද්ගල මණ්ඩලයට නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ කරුණු;

(ආ) පුද්ගල මණ්ඩලයෙහි රැස්වීම් හා ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ; හා

(ඇ) පුද්ගල මණ්ඩලයෙහි කටයුතු හා සම්බන්ධ වෙන යම් කරුණක්.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතෙහි සම්පාදනය කරනු ලැබූ කිසි ම ව්‍යවස්ථාවක්, ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන තුරු බල නො පෑ යුතු ය.

(3) 19 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියෙහි හෝ (3) වෙනි උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සම්පාදනය කරනු ලැබූ යම් ව්‍යවස්ථාවක්, මුදල් ඇමතිවරයාගේ පූර්ව එකඟත්වය නොමැති ව ඇමතිවරයා විසින් අනුමත නො කළ යුතු ය.

## VII වෙනි කොටස

### ආයුර්වේද වෛද්‍යවරයන්, ඖෂධ සංයෝගකයන් හා සාත්තු සේවකයන් ලියා පදිංචි කිරීම

50. මේ කොටසෙහි—

මේ කොටසෙහි කාර්යයන් සඳහා සමහර පද විස්තර කිරීම.

(අ) "සභාව" යන්නෙන් ආයුර්වේද වෛද්‍ය සභාව අදහස් වේ.

(ආ) "ලේඛකාධිකාරි" යන්නෙන් සභාවෙහි ලේඛකාධිකාරීවරයා අදහස් වේ.

51. (1) සභාව විසින්—

නාම ලේඛන.

(අ) ආයුර්වේද වෛද්‍යවරයන් ලියාපදිංචි කිරීම සඳහා සාමාන්‍ය නාම ලේඛනයක් හා විශෙෂ නාම ලේඛනයක් ;

(ආ) ආයුර්වේද ඖෂධ සංයෝගකයන් ලියාපදිංචි කිරීම සඳහා නාම ලේඛනයක් ; හා

(ඇ) ආයුර්වේද සාත්තු සේවකයන් ලියාපදිංචි කිරීම සඳහා නාම ලේඛනයක් ද

තබාගැනීම හා පවත්වාගෙන යාම කළ යුතු ය.

(2) (1) වෙනි උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ නාම ලේඛන තබා ගැනීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වග කිව යුතු සභාවෙහි නිලධරයා ලේඛකාධිකාරීවරයා විය යුතු ය.

(3) ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය මගින් පවත්වාගෙන යනු ලබන ස්වදේශීය වෛද්‍යවරයන්ගේ සාමාන්‍ය නාම ලේඛනයෙහි හා විශේෂ නාම ලේඛනයෙහි අයිතිය, නියම කරනු ලැබූ දිනයේ සිට සභාව සතු විය යුතු ය. ඒ සාමාන්‍ය නාම ලේඛනය මේ පනත යටතෙහි සභාව විසින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවරයන්ගේ සාමාන්‍ය නාම ලේඛනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. ඒ විශේෂ නාම ලේඛනය මේ පනත යටතෙහි සභාව විසින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවරයන්ගේ විශේෂ නාම ලේඛනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ආයුර්වේද වෛද්‍යවරයන් වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා කරනු ලබන ඉල්ලීම.

52. (1) සාමාන්‍ය නාම ලේඛනයෙහි හෝ විශේෂ නාම ලේඛනයෙහි ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථාවලින් නියම කළ හැකි ආකෘතියක ලිපිගත කොට ලේඛකාධිකාරීවරයාගේ මාර්ගයෙ: සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සාමාන්‍ය නාම ලේඛනයෙහි ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක්—

(අ) 55 වෙනි වගන්තියෙහි (1) වෙනි උපවගන්තිය යටතෙහි ඒ වැනි ලියාපදිංචි කිරීමකට ඉල්ලුම්කරුට හිමිකමක් නැතැ යි යන හේතුව පිට, හෝ

(ආ) 57 වෙනි වගන්තියෙහි (1) වෙනි උපවගන්තියෙහි නියමිත යම් හේතුවක් පිට,

මිස සභාව විසින් ප්‍රතික්ෂෙප නො කළ යුතු ය.

(3) ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් විශේෂ නාම ලේඛනයෙහි ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්—

(අ) 55 වෙනි වගන්තියෙහි (2) වෙනි උප වගන්තිය යටතෙහි ඒ වැනි ලියාපදිංචි කිරීමකට ඉල්ලුම්කරුට හිමිකමක් නැතැ යි යන හේතුව පිට, හෝ

(ආ) 57 වෙනි වගන්තියෙහි (1) වෙනි උප වගන්තියෙහි නියමිත යම් හේතුවක් පිට,

මිස සභාව විසින් ප්‍රතික්ෂෙප නො කළ යුතු ය.

(3) ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සාමාන්‍ය නාම ලේඛනයෙහි හා විශේෂ නාම ලේඛනයෙහි යන ලේඛන දෙකෙහි ම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

**53.** (1) ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථාවලින් නියම කළ හැකි ආකෘතියක ලිපිගත කොට, ලේඛකාධිකාරීවරයාගේ මාර්ගයෙන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

ආයුර්වේද ඖෂධ සංයෝගකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා කරනු ලබන ඉල්ලීම.

(2) ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක්—

(අ) 56 වෙනි වගන්තිය යටතෙහි එ වැනි ලියාපදිංචි කිරීමක් සඳහා ඉල්ලුම්කරුට හිමිකමක් නැතැ යි යන හේතුව පිට, හෝ

(ආ) 57 වෙනි වගන්තියෙහි (1) වෙනි උපවගන්තියේ නියමිත යම් හේතුවක් පිට,

මිස සභාව විසින් ප්‍රතික්ෂේප නො කළ යුතු ය.

**54.** ආයුර්වේද වෛද්‍යවරයකු හෝ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු වශයෙන් යම් තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම, සභාව විසින් ඉහතින් අවලංගු කරනු ලැබුවේ ද ඒ තැනැත්තා විසින් අවස්ථානුකූල ව ආයුර්වේද වෛද්‍යවරයකු හෝ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. සභාව විසින් ඒ ඉල්ලීම් පිළිගෙන මේ කොටසෙහි විධිවිධාන අනු ව ඒ සම්බන්ධයෙන් සුදුස්සක් කළ හැකි ය.

ලියාපදිංචි කිරීම ඉහතින් අවලංගු කරනු ලැබූ තැනැත්තන් විසින් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම.

**55.** (1) යම් තැනැත්තකු—

ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම්.

(අ) ලංකාවේ පුරවැසියකු; හා

(ආ) ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබූ අභිඥාන පත්‍රයක් හෝ ආයුර්වේද වෛද්‍ය සභා ආඥාපනත යටතෙහි ආයුර්වේද වෛද්‍ය සභාව විසින් නියමිත දිනයෙහි හෝ ඊට පෙර දෙනු ලැබූ සහතිකයක් දරන්නකු; හෝ

(ඇ) මේ පනත යටතෙහි පිහිටවනු ලැබූ ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබූ අභිඥාන පත්‍රයක් දරන්නකු; හෝ

(ඈ) ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් මේ පනතේ කාර්‍යයන් සඳහා අනුමත කරනු ලැබූ ආයතනයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ලංකාවේ හෝ ඉන්දියාවේ වෙන යම් ආයතනයකින් ප්‍රදානය කරනු ලැබූ අභිඥාන පත්‍රයක් දරන්නකු; හෝ

(ඉ) කාර්යක්ෂම ලෙස ආයුර්වේද වෛද්‍ය කර්මයෙහි යෙදීමට සුදුසු දැනීමක්, පළපුරුද්දක් හා දක්ෂකමක් තමහට තිබෙන බවට සභාව සෑහීමට පත් කරන්නකු,

නො වූ විට ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සාමාන්‍ය නාම ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඔහුට හිමිකමක් නො තිබිය යුතු ය.

(2) (අ) ලංකාවේ පුරවැසියකු වීමෙන් ; හා

(ආ) ආයුර්වේදයේ යම් විශේෂ අංශයක් සම්බන්ධයෙන් තමාහට විශේෂ දැනීමක් හා සෑහෙන පළපුරුද්දක් හා දක්ෂකමක් තිබෙන බවට සභාව සෑහීමට පත් කිරීමෙන්, මිස ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් විශේෂ නාම ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබීම සඳහා කිසි ම තැනැත්තකුට හිමිකමක් නො තිබිය යුතු ය.

එසේ වුව ද, (අ) ඡේදයෙහි හා (ආ) ඡේදයෙහි අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අතිරේක ව, ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සාමාන්‍ය නාම ලේඛනයෙහි නම ලියාපදිංචි කරනු ලැබුවහොත් මිස, ඇමතිවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට විශේෂ නාම ලේඛනයෙහි නම ලියාපදිංචි කිරීම සඳහා කිසි ම තැනැත්තකුට හිමිකමක් නො තිබිය යුතු ය.

*ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම්.*

56. (අ) ලංකාවේ පුරවැසියකු වීමෙන් ; හා

(ආ) අවස්ථාවෝචිත පරිදි කාර්යක්ෂම ලෙස ආයුර්වේද ඖෂධ සංයෝග කිරීමේ විද්‍යාව හෝ ආයුර්වේද සාත්තු සේවය සම්බන්ධයෙන් තමහට සෑහෙන දැනීමක්, පළපුරුද්දක් හා දක්ෂකමක් තිබෙන බවට සභාව සෑහීමට පත් කිරීමෙන්,

මිස ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා කිසිම තැනැත්තකුට හිමිකමක් නො තිබිය යුතුය.

*ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි හෝ අවලංගු කළ හැකි හෝ අත්හිටවිය හැකි හේතු.*

57. (1) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියපාදිංචි කරනු ලැබීම සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් සභාව විසින් ආඥාවක මාර්ගයෙන් ප්‍රතික්ෂේප කළ හැකි ය. නැතහොත් පහත සඳහන් හේතු උඩ, එ වැනි වෛද්‍යවරයකු, ඖෂධ සංයෝගකයකු හෝ සාත්තු සේවකයකු වශයෙන් යම් තැනැත්තකු ලියාපදිංචි කරනු ලැබීම අවලංගු කළ හැකි ය. නැතහොත් නියමිත කාලසීමාවක් සඳහා අත්හිට විය හැකි ය. එනම් :—

(අ) ඔහු එ වැනි වෛද්‍යවරයකු, ඖෂධ සංයෝගකයකු හෝ සාත්තු සේවකයකු වීමට නුසුදුසු බව දැක්වෙන පරිදි වරදක් සම්බන්ධයෙන් බලය ලත් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබීම ; හෝ

(ආ) එ වැනි වෛද්‍යවරයකු, ඖෂධ සංයෝගකයකු හෝ සාත්තු සේවකයකු වශයෙන් යම් වැරදි හැසිරීමක් සම්බන්ධයෙන් ඔහු වරදකරු වීම ; හෝ

(ඇ) එ වැනි ලියාපදිංචි කිරීමක් සඳහා සුදුසුකම වූ යම් අභිඥාන පත්‍රයක් හෝ සහතික පත්‍රයක් ඔහුට අහිමි කිරීම.

(2) (1) වෙනි උපවගන්තියෙහි (අ) ඡේදයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන්, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු වූ යම් තැනැත්තකුට විරුද්ධ ව අධිකරණයක් ඉදිරිපිට යම් නඩු පැවරීමක් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් ඒ නීතිකෘත්‍ය සම්බන්ධයෙන් අවසාන නඩු තීන්දුවක්, ආඥාවක් හෝ වෙනත් නිශ්චයක් කරනු ලබන තුරු, සභාව විසින් ආඥාවකින් වෛද්‍යවරයකු, ඖෂධ සංයෝගකයකු හෝ සාත්තු සේවකයකු වශයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම අත්හිට විය හැකි ය.

(3) යම් තැනැත්තකු ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සාමාන්‍ය නාම ලේඛනය හා විශේෂ නාම ලේඛනය යන දෙකෙහි ම ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක, සාමාන්‍ය නාමලේඛනයෙහි ඔහුගේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබුවේ නම්, විශේෂ නාම ලේඛනයෙහි ඔහුගේ ලියාපදිංචි කිරීම ද සභාව විසින් ආඥාවක මාර්ගයෙන් අවලංගු කළ යුතු ය.

(4) ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ අත්හිටවීමේ ආඥාවක් කිරීමකට විරුද්ධ ව කරුණු දැක්වීමේ අවස්ථාවක් යම් තැනැත්තකුට දෙනු ලබන තුරු (1) වෙනි උපවගන්තිය හෝ (2) වෙනි උපවගන්තිය හෝ (3) වෙනි උපවගන්තිය යටතෙහි එවැනි තැනැත්තකුට විරුද්ධ ව සභාව විසින් ආඥාවක් නිකුත් නො කළ යුතු ය. එසේ කරුණු දක්වනු ලබන යම් අවස්ථාවක දී—

(අ) ඒ තැනැත්තාට විරුද්ධ ව සාක්ෂි ගෙන හැර දැක්වීමට හා නඩුව ඉදිරිපත් කිරීමට නීතිඥයකුගේ ද, සභාවට උපදෙස් දීමට හා අධිකරණ විනිශ්චය සහායකයකු වශයෙන් ක්‍රියා කිරීමට නීතිඥයකුගේ ද සේවාවන් සභාව විසින් ලබාගත හැකි ය;

(ආ) ඒ තැනැත්තා විසින් තමා වෙනුවෙන් සාක්ෂි ගෙන හැර දැක්වීමට හා තමාගේ නඩුව ඉදිරිපත් කිරීමට ද නීතිඥයකුගේ සේවාවන් ලබා ගත හැකි ය.

(5) යම් තැනැත්තකු සම්බන්ධයෙන් සභාව විසින් (1) වෙනි උපවගන්තිය හෝ (2) වෙනි උපවගන්තිය හෝ (3) වෙනි උපවගන්තිය යටතෙහි කරනු ලැබූ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ අත්හිටවීමේ කිසි ම ආඥාවක්, 63 වෙනි වගන්තිය යටතෙහි ආඥාවට විරුද්ධ ව ඇමතිවරයාට අයාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ඉකුත් වන තුරු ද, ඒ වගන්තිය යටතෙහි එයට විරුද්ධ ව අයාචනයක් නිසියාකාර ඇමතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක අයාචනයෙහි දී ඒ ආඥාව අනුමත කළහොත් මිස, හා අනුමත කරන තුරු එය ක්‍රියාත්මක නො විය යුතු ය.

58. ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමකට

සභාව විසින් කරනු ලැබූ ආඥාවල පිටපත් භාරදීම.

අවසර දෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් හෝ එ වැනි වෛද්‍ය වරයකු, ඖෂධ සංයෝගකයකු හෝ සාත්තු සේවකයකු වශයෙන් යම් තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම අවලංගු කරමින් හෝ අත්හිට වමින් සභාව විසින් කරනු ලැබූ ආඥාවක පිටපත් ලේඛකාධිකාරීවරයා විසින් ඒ තැනැත්තාට ලියාපදිංචි කරනු ලැබූ තැපැලෙන් යැවිය යුතු ය.

සභාව විසින් කරනු ලැබූ ආඥාවල බලපෑම හා ඒ ආඥා ක්‍රියාත්මක කිරීම ලේඛකාධිකාරි වරයාගේ යුතු කම බව.

59. (1) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගක යකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ ඉල්ලීමකට අවසර දෙමින් සභාව විසින් කරනු ලැබූ ආඥාවක්, ඒ ආඥාවේ නියමිත දිනයෙහි දී ක්‍රියාත්මක විය යුතු ය. තවද අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනයෙහි ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛනයෙහි හෝ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාම ලේඛනයෙහි ඒ දිනයෙහි සිට ලියාපදිංචි කරනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකමක් ලැබිය යුතු ය. ඒ තැනැත්තාගේ නම ද, මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ඒ තැනැත්තා සම්බන්ධ එ වැනි විස්තර ද, 60 වෙනි වගන්තියෙහි (2) වෙනි උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ලේඛකාධිකාරිවරයාගේ යුතුකම විය යුතු ය.

(2) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් යම් තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම අවලංගු කරමින් සභාව විසින් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ නම හා විස්තර, ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනයෙන්, ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛනයෙන් හෝ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාම ලේඛනයෙන් අවස්ථාවෝචිත පරිදි අස් කිරීම ලේඛකාධිකාරිවරයාගේ යුතුකම විය යුතු ය.

(3) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් යම් තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම අත්හිටවමින් සභාව විසින් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක වන අවස්ථාවක, එ සේ අත්හිටවනු ලැබූ කාලය තුළ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු කෙරෙහි අවස්ථාවෝචිත පරිදි මේ පනතින් පවරනු ලබන අයිතිවාසිකම් හා වරප්‍රසාද ඔහු විසින් ක්‍රියාවේ යෙදීම හෝ භුක්ති විඳීම නො කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ ගාස්තු.

60. (1) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, මේ පනත යටතෙහි සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ගණනක් විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, යම් තැනැත්තකු විසින් ගෙවන තුරු ලේඛකාධිකාරීවරයා විසින් ඒ තැනැත්තාගේ නම ආයුර්වේද වෛද්‍ය වරයන්ගේ නාම ලේඛනයෙහි, ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛනයෙහි හෝ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාම ලේඛනයෙහි ලියාපදිංචි නො කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය.

61. ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් තැනැත්තකු ලියා පදිංචි කරනු ලබන අවස්ථාවක, මේ පනත යටතේ සභාව විසින් පනවනු ලැබූ ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි අන්දමේ ආකෘතියෙන් යුත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලේඛකාධිකාරී විසින් ඒ තැනැත්තා වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතු ය.

අතිරේක සුදුසුකම් ලේඛනවල ඇතුළත් කිරීම.

62. අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනයෙහි, ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛන යෙහි හෝ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාම ලේඛනයෙහි තමා සම්බන්ධයෙන් සඳහන් නො වූ ද තම වෘත්තියට අදාළ වූ ද යම් පිළිගත් සුදුසුකමක්, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍ය වරයකු විසින් ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු විසින් හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු විසින් ලබා ගන්නා අවස්ථාවක, මේ පනත යටතේ සභාව විසින් පනවනු ලැබූ ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයේ ගාස්තුවක් ගෙවූ විට, තමා සම්බන්ධයෙන් ඒ අලුත් සුදුසුකම ඒ නාම ලේඛනයෙහි ඇතුළු කරවා ගැනීමට ඒ තැනැත්තාට බලය ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි "පිළිගත් සුදුසුකම" යන්නෙන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් මේ පනතේ කාර්යයන් සඳහා පිළිගත් යම් සුදුසුකමක් අදහස් වේ.

ආයාචනා.

63. (1) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගක යකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා යම් තැනැත්තකුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් හෝ ඒ ලියාපදිංචි කිරීම අවලංගු කරමින් හෝ අත්හිටවමින් මේ කොටස යටතේ සභාව විසින් යම් ආඥාවක් පනවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් තමා වෙත ඒ ආඥාව දන්වනු ලැබීමෙන් පසු දින දහහතරක් ඇතුළත, ඒ ආඥාවට විරුද්ධ ව ඇමතිවරයා වෙත ආයාචනය කළ හැකි ය.

(2) (1) වෙනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් ආයාචනයක් විභාග වීමේ දී, ආයාචක විසින් හෝ සභාව විසින්, නැතහොත් ආයාචක වෙනුවෙන් හෝ සභාව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් කරුණු හෝ සාක්ෂි ඇමතිවරයා විසින් විභාග කිරීමෙන් පසු, මේ පනතේ යම් විධිවිධානයක් සමඟ නො ගැළපෙන්නක් නො වන්නා වූ ද සාධාරණ ය යි ඇමතිවරයාට පෙනී යා හැකි අන්දමේ වූ ද තීරණයක් ඇමතිවරයා විසින් ආයාචනය සම්බන්ධයෙන් කළ යුතු ය.

(3) (1) වෙනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් ආයාචනයක් පිළිබඳ ව ඇමතිවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු ය. තව ද ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමකට අවසර දිය යුතු ය යි තීරණය වන යම් අවස්ථාවක දී, 60 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ තැනැත්තාගේ නම හා ඒ තැනැත්තා පිළිබඳ ව මේ පනත යටතේ සභාව විසින් පනවනු ලැබූ ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි අන්දමේ විස්තර, අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනයෙහි, ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛනයෙහි හෝ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ලේඛකාධිකාරීවරයාගේ යුතුකම විය යුතු ය.

"වෛද්‍යාචාර්ය" යන පටබැඳි නාමය පාවිච්චි කිරීම.

64. (1) අන් කිසි තැනත්තකුට නො ව, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකුට ස්වකීය නමට පෙර හෝ පසු ව "වෛද්‍යාචාර්ය" යන පටබැඳි නාමය පාවිච්චි කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වෙනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

"නීත්‍යනුකූල ව හෝ නිසි පරිදි සුදුසුකම් ලත් ආයුර්වේද වෛද්‍යවරයා" යන්නෙහි අර්ථය.

65. යම් ලිඛිත නීතියක කාර්‍යයන් සඳහා, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු නීත්‍යනුකූල ව හෝ නිසි පරිදි සුදුසුකම් ලත් ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස සැලකිය යුතු ය.

"නීත්‍යනුකූල ව හෝ නිසි පරිදි සුදුසුකම් ලත් ආයුර්වේද ඖෂධ සංයෝගකයකු" යන්නෙහි අර්ථය.

66. යම් ලිඛිත නීතියක කාර්‍යයන් සඳහා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු නීත්‍යනුකූල ව හෝ නිසි පරිදි සුදුසුකම් ලත් ආයුර්වේද ඖෂධ සංයෝගකයකු ලෙස සැලකිය යුතු ය.

ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වරප්‍රසාද.

67. (1) ලියාපදිංචි කරනු ලැබූ සෑම ආයුර්වේද වෛද්‍යවරයකු ම ආයුර්වේද වෘත්තියෙහි නියුක්ත වීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන කරුණු උදෙසා තමා විසින් ඉල්ලා සිටිනු ලබන යම් සාධාරණ මුදලක් සඳහා බලය ඇති අධිකරණයක නඩුවක් මගින් නිසි නීති මාර්ගයකින් නඩු පැවරීමට හා ඒ මුදල අය කර ගැනීමටත් ලියාපදිංචි කරනු ලැබූ සෑම ආයුර්වේද වෛද්‍යවරයකුට හිමිකම් ලැබිය යුතු ය:—

(අ) ස්වකීය වෘත්තීය කාර්‍යයෙහි දී ඉටු කරනු ලැබූ යම් සේවාවන් සඳහා හෝ දෙනු ලැබූ උපදෙස් සඳහා හෝ කරනු ලැබූ වැඩ සඳහා වූ ගාස්තුව;

(ආ) තමා විසින් සපයනු ලැබූ යම් ඖෂධ වර්ග සඳහා, ඖෂධ සංයෝග සඳහා හෝ උපකරණ සඳහා හෝ කෑමට හෝ බීමට ගන්නා බෙහෙත් ද්‍රව්‍ය සඳහා අය කරන මුදල; හෝ

(ඇ) යම් රෝගියකුට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ කාර්යයන් සම්බන්ධ ව හෝ ඒ සඳහා තමා විසින් දරනු ලැබූ විය හියදම්.

*ලියාපදිංචි නො කරනු ලැබූ ආයුර්වේද වෛද්‍ය වරයන් ගේ අපොහොසත් කම.*

68. (1) 67 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ කවර විස්තරයකින් වුව ද යුක්ත වූ යම් ගාස්තුවක්, මුදලක් හෝ විය හියදමක් අය කර ගැනීම සඳහා යම් අධිකරණයක යම් නඩුවක් පැවරීමට හෝ පවත්වාගෙන යාමට ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු නො වන කිසි ම තැනැත්තකුට හිමිකම් නො ලැබිය යුතු ය.

*ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ව්‍යාජ ලෙස පෙනී සිටීම හෝ ලියාපදිංචි නො වී සිටිය දී ලාභය තකා ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් එම වෘත් තියෙහි නියුක්ත වීම වරදක් බව.*

69. (1) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු නො වන තැනැත්තකු—

(අ) තනිව ම හෝ අන් කිසි වචනයක් සමඟ හෝ අකුරු සමග සම්බන්ධ කොට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන පටබැඳි නම ඉංග්‍රීසියෙන් හෝ ඊට සමාන පාඨය අන් කිසි භාෂාවකින් පාවිච්චි කළහොත් ; හෝ

(ආ) ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු ය යි දක්වමින් යම් නාමයක්, පටබැඳි නාමයක්, එකතුවක් හෝ විස්තරයක් පාවිච්චි කළහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(2) ආයුර්වේද වෛද්‍යවරයන්ගේ විශේෂ නාම ලේඛනයෙහි නම ඇතුළත් තැනැත්තකු නො වන ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද වෛද්‍යවරයකු තමන්ගේ නම එ ලෙස ඇතුළත් කර ඇතැ යි දක්වන යම් නාමයක්, පටබැඳි නාමයක්, එකතුවක් හෝ විස්තරයක් පාවිච්චි කළහොත්, හෝ එ සේ දක්වන යම් ආකාරයක යම් ක්‍රියාවක් අන් ලෙසකින් කළහොත්, ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(3) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු නො වන යම් තැනැත්තකු ආයුර්වේද වෛද්‍ය කර්මයෙහි හෝ ආයුර්වේද ශල්‍ය වෛද්‍ය විද්‍යාවෙහි ලාභය තකා නියුක්ත වුවහොත්, ඔහු වරදකට වරදකරු විය යුතුය.

*වෘත් තියෙහි යෙදීමට ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයන් හට හා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයන් හට හිමිකම් ලැබිය යුතු බව.*

70. (1) ලියාපදිංචි කරනු ලැබූ සෑම ආයුර්වේද ඖෂධ සංයෝගකයකුට ම ආයුර්වේද ඖෂධ සංයෝගයෙහි නියුක්ත වීමට හිමිකම් තිබිය යුතු ය.

(2) ලියාපදිංචි කරනු ලැබූ සෑම ආයුර්වේද සාත්තු සේවකයකුටම ආයුර්වේද සාත්තු සේවයෙහි යෙදීමට හිමිකම් තිබිය යුතු ය.

*ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ව්‍යාජ ලෙස පෙනී සිටීම වරදක් බව.*

71. (1) ලියාපදිංචි කරනු ලැබූ, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු නො වන තැනැත්තකු—

(අ) තනිව ම හෝ අන් කිසි වචනයක් සමඟ හෝ අකුරු සමග සම්බන්ධ කොට අවස්ථාවෝචිත පරිදි "ලියාපදිංචි කළ ආයුර්වේද ඖෂධ සංයෝගක" හෝ "ලියාපදිංචි කළ ආයුර්වේද සාත්තු සේවක" යන පටබැඳි නාමය ඉංග්‍රීසියෙන් හෝ ඊට සමාන පාඨය අන් කිසි භාෂාවකින් පාවිච්චි කළහොත් ; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකු ය යි දක්වන යම් නාමයක්, පටබැඳි නාමයක්, එකතුවක් හෝ විස්තරයක් පාවිච්චි කළහොත්,

ඔහු, එ සේ කිරීමට (2) වෙනි උපවගන්තිය ප්‍රකාර හිමිකම් ලැබී නැතොත්, වරදකට වරදකරු විය යුතු ය.

(2) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක අයිතිකරු වශයෙන් 10 වෙනි වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ සිටින තැනැත්තකු විසින්, තමා ලියාපදිංචි කරනු ලැබ [illegible] [illegible] නො වුව ද, ඒ ඖෂධ නිෂ්පාදනාගාරයේ ව්‍යාපාරික කටයුතු සඳහා, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකි යම් නාමයක්, පටබැඳි නාමයක්, එකතුවක් හෝ විස්තරයක් පාවිච්චි කළ හැක්කේ—

(අ) ඒ ඖෂධ නිෂ්පාදනාගාරයෙහි බෙහෙත්, ඖෂධ වර්ග හෝ විෂ ද්‍රව්‍ය වෙළෙඳාම හෝ සංයෝග කිරීම පෞද්ගලික ව පරිපාලනය කිරීමට හා කළමනා කිරීමට ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු සේවයෙහි යෙදූවහොත්, හා

(ආ) එ ලෙස සේවයෙහි යොදනු ලබන ඖෂධ සංයෝගකයාගේ නම සභාව වෙත ලිපියකින් දන්වා යවා ඇතොත් ය.

ලියාපදිංචි නො වී සිටිය දී, ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලාභය තකා වෘත්තියෙහි යෙදීම වරදක් බව.

72. ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු නො වන යම් තැනැත්තකු අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද ඖෂධ සංයෝගයෙහි හෝ ආයුර්වේද සාත්තු සේවයෙහි ලාභය තකා නියුක්ත වුවහොත්, ඔහු වරදකට වරදකරු විය යුතු ය.

ඇතැම් තැනැත්තන් මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන් ලෙස සලකනු ලබන බව.

73. මේ පනත යටතේ තබනු ලබන ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාම ලේඛනයක් ලෙස, 51 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තියේ ප්‍රකාර සලකනු ලබන, යම් ලේඛනයක ස්වකීය නම ඇතුලත් කොට ඇති සෑම තැනැත්තකු ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

## VIII වෙනි කොටස

### සාමාන්‍ය කරුණු

ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සාමාජිකයන් ඉදිරියටත් සේවයෙහි යෙදවීම.

74. මීට පෙර ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යන නමින් හඳුන්වනු ලැබූ දෙපාර්තමේන්තුවෙහි පදවි නාමය වෙනස් කරනු ලැබූ නමුදු, නියම කරනු ලැබූ දිනයෙහි ඒ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් වශයෙන් තිල දරන හෝ ඒ දිනයෙහි

ඒ දෙපාර්තමේන්තුවේ යම් අන්දමකින් සේවයෙහි යෙදී සිටින සියලු ම තැනැත්තන්, මේ පනතින් සංස්ථාපිත ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි නිල දැරීම හෝ සේවයෙහි යෙදීම ඉදිරියටත් කළ යුතු ය.

ස්වදේශීය වෛද්‍ය කො
සාරිස්වරයාගේ
පදවි නාමය
වෙනස් කිරීමේ
ප්‍රතිඵලයක් ව
යෙන් වෙන
ලිඛිත නී
ආදිය සංශෝ
නය කිරීම
ගිවිසුම් ආදි
සඳහා අදාළ

75. (1) වෙන යම් ලිඛිත නීතියකින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ, සම්පාදනය කරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ වෙන යම් ලිඛිත නීතියක, යම් දැන්වීමක, බලපත්‍රයක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් විධිවිධානයක "ස්වදේශීය වෛද්‍ය කොමසාරිස්" යන පාඨය යම් තැනක සඳහන් වේද, ඒ වෙනුවට "ආයුර්වේද කොමසාරිස්" යන පාඨය ආදේශ කළ යුතු ය. ඒ අනුකූල ව ස්වදේශීය වෛද්‍ය කොමසාරිස් හැඳින්වීමට "කොමසාරිස්" යන කෙටි යෙදුම එ වැනි විධිවිධානයක [illegible] හඳුන්වන ලෙස කියවා පහදා ගත යුතු ය.

(2) (නියම කරනු ලැබූ දිනයට පෙර සංස්ථාපිත පරිදි) ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ යම් නිලයක පදවි නාමය වෙනස් කරනු ලැබුවේ නම්—

(අ) ඒ පදවි නාමය සම්බන්ධයෙන් මේ උපවගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය යි ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවකින් ඇමතිවරයා විසින් ප්‍රකාශ කළ හැකි ය.

(ආ) ඒ ප්‍රකාශය කරනු ලැබීමෙන් පසු, වෙන යම් ලිඛිත නීතියකින් නිකුත් කරනු ලැබූ, සම්පාදනය කරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ වෙන යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, බලපත්‍රයක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් විධිවිධානයක යම් තැනක ඒ පදවි නාමය සඳහන් වේ ද, ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි අනුරූප නිලයට දෙනු ලැබූ අලුත් පදවි නාමය ඒ වෙනුවට ආදේශ කළ යුතු ය.

(3) ස්වදේශීය වෛද්‍ය කොමසාරිස් හෝ ඔහුගේ නිල තත්ත්වය අනු ව ඒ දෙපාර්තමේන්තුවෙහි යම් නිලධරයකු විසින් හෝ සමඟ නියම කරනු ලැබූ දිනයට පෙර කරනු ලැබූ, නිකුත් කරනු ලැබූ, හෝ ඉෂ්ට කරනු ලැබූ මොන යම් අන්දමක වුව ද සෑම ගිවිසුමක්, පොරොන්දු පත්‍රයක් හෝ වෙනත් නීත්‍යනුකූල ලේඛනයක් හෝ ලේඛනයක් නියම කරනු ලැබූ දිනයෙහි හා ඉන්පසු ආයුර්වේද කොමසාරිස් හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ඔහුගේ නිල තත්ත්වය අනු ව අනුරූප නිලය දරන නිලධරයා විසින් හෝ සමග කළ යුතු හෝ කරනු ලැබූ, නිකුත් කළ යුතු හෝ නිකුත් කරනු ලැබූ, ඉෂ්ට කළ යුතු හෝ ඉෂ්ට කරනු ලැබූ, ලෙස සැලකිය යුතු ය. එ වැනි යම් ගිවිසුමක, පොරොන්දු පත්‍රයක හෝ වෙනත් නීත්‍යනුකූල ලේඛනයක හෝ ලේඛනයක (නියම කරනු ලැබූ දිනයට පෙර සංස්ථාපිත) ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවෙහි යම් නිලධරයකු සම්බන්ධයෙන් කරනු ලබන යම් සඳහන් කිරීමක්, ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි අනුරූප නිලය දරන නිලධරයා සම්බන්ධයෙන් කරනු ලැබූ සඳහන් කිරීමක් වශයෙන් කියවා පහදා ගත යුතු ය.

ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ හා ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාවේ නම වෙනස් කිරීම හා ආනුෂංගික විධිවිධාන.

76. (1) නියම කරනු ලැබූ දිනයෙහි හා ඉන්පසු ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය වශයෙන් නම් කොට හඳුන්වනු ලැබිය යුතු ය. තව ද ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාව, ආයුර්වේද මහාරෝග්‍යශාලාව වශයෙන් නම් කොට හඳුන්වනු ලැබිය යුතු ය.

(2) මීට පෙර ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය නමින් හඳුන්වනු ලැබූ විද්‍යාලයෙහි හෝ මීට පෙර ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාව නමින් හඳුන්වනු ලැබූ ආරෝග්‍යශාලාවෙහි පදවි නාමය වෙනස් කරනු ලැබූ නමුදු, නියම කරනු ලැබූ දිනයෙහි ඒ විද්‍යාලයෙහි හෝ ආරෝග්‍යශාලාවෙහි කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් වශයෙන් නිල දරන හෝ ඒ දිනයෙහි ඒ විද්‍යාලයෙහි හෝ ඒ ආරෝග්‍යශාලාවෙහි යම් අන් ධුරයකින් සේවයෙහි යෙදී සිටින සියලු ම තැනැත්තන්, අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි හෝ ආයුර්වේද මහාරෝග්‍යශාලාවෙහි නිල දැරීම හෝ සේවයෙහි යෙදීම ඉදිරියටත් කළ යුතු ය.

(3) වෙන යම් ලිඛිත නීතියකින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ, සම්පාදනය කරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ වෙන යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, බලපත්‍රයක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් විධිවිධානවල "ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති" යන පාඨය යම් තැනක සඳහන් වේ ද, "ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති" යන පාඨය ඒ වෙනුවට ආදේශ කළ යුතු ය. තවද, "ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී" යන පාඨය යම් තැනක සඳහන් වේ ද, "ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී" යන පාඨය ඒ වෙනුවට ආදේශ කළ යුතු ය; ඒ අනුකූලව ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හෝ ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී හැඳින්වීම සඳහා "විද්‍යාලයාධිපති" හෝ "වෛද්‍ය අධිකාරී" යන කෙටි යෙදුම එ වැනි යම් විධිවිධානයක යම් තැනක යොදනු ලැබුවේ ද, ඒ කෙටි යෙදුම අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති හෝ මහායුර්වේද ආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී සම්බන්ධයෙන් කරනු ලැබූ හැඳින්වීමක් වශයෙන් කියවා පහදා ගත යුතු ය.

(4) (නියම කරනු ලැබූ දිනයට පෙර සංස්ථාපිත පරිදි) ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයෙහි හෝ ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාවෙහි යම් නිලයක පදවි නාමය වෙනස් කරනු ලැබුවහොත්—

(අ) මේ වගන්තියේ විධිවිධාන ඒ පදවි නාමය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය යි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ඇමතිවරයා විසින් ප්‍රකාශ කළ හැකි ය;

(ආ) තවද ඒ ප්‍රකාශය කරනු ලැබීමෙන් පසු, වෙන යම් ලිඛිත නීතියකින් නිකුත් කරනු ලැබූ, සම්පාදනය කරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ වෙන යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, බලපත්‍රයක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් විධිවිධානයක යම් තැනක

ඒ පදවි නාමය සඳහන් වේ ද, අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි හෝ ආයුර්වේද මහාරෝගයශාලාවෙහි අනුරූප නිලයට දෙනු ලැබූ අළුත් පදවි නාමය ඒ පදවි නාමය වෙනුවට ආදේශ කළ යුතු ය.

(5) ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයාධිපති විසින් හෝ ඔහු සමඟ හෝ ස්වදේශීය වෛද්‍ය ආරෝගයශාලාවේ වෛද්‍ය අධිකාරී විසින් හෝ ඔහු සමග හෝ ඒ විද්‍යාලයේ යම් නිලධරයකුගේ නිල තත්ත්වය අනු ව ඔහු විසින්, නියම කරනු ලැබූ දිනයට පෙර කරනු ලැබූ, නිකුත් කරනු ලැබූ, ඉෂ්ට කරනු ලැබූ, මොන යම් අන්දමක වුව ද සෑම ගිවිසුමක්, පොරොන්දු පත්‍රයක් හෝ වෙනත් නීත්‍යනුකූල ලේඛනයක් හෝ ලේඛනයක් නියම කරනු ලැබූ දිනයෙහි හා ඉන්පසු අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයාධිපති විසින් හෝ ඔහු සමඟ හෝ ආයුර්වේද මහා ආරොගයශාලාවෙ වෛද්‍ය අධිකාරි විසින් හෝ ඔහු සමඟ හෝ ඒ විද්‍යාලයෙහි හෝ ආරෝගයශාලාවෙහි අනුරූප පදවිය දරන නිලධරයාගේ නිල තත්ත්වය අනු ව ඔහු සමඟ කළ යුතු හෝ කරනු ලැබූ, නිකුත් කළ යුතු හෝ නිකුත් කරනු ලැබූ, ඉෂ්ට කළ යුතු හෝ ඉෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය; තවද (නියම කරනු ලැබූ දිනයට පෙර සංස්ථාපිත පරිදි) ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ හෝ ස්වදේශීය වෛද්‍ය ආරෝගයශාලාවේ යම් නිලධරයකු සම්බන්ධයෙන් එ බඳු යම් ගිවිසුමක, පොරොන්දු පත්‍රයක හෝ වෙනත් නීත්‍යනුකූල ලේඛනයක හෝ ලේඛනයක කරනු ලැබූ යම් සඳහන් කිරීමක්, අවස්ථාවෝචිත පරිදි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙහි හෝ ආයුර්වේද මහාරෝගයශාලාවෙහි අනුරූප නිලය දරන නිලධරයා සම්බන්ධයෙන් කරනු ලැබූ සඳහන් කිරීමක් වශයෙන් කියවා පහදා ගත යුතු ය.

77. (1) ආයුර්වේද වෛද්‍ය කර්මයේ හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ කාර්‍ය්‍යයන් සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ පිළියෙල කිරීම තහනම් කිරීමට, විධිමත් කිරීමට හෝ පාලනය කිරීමට අවශ්‍ය ය යි නියෝග පැනවීමට බලය පවරනු ලැබූ බලධරයා විසින් සැලකිය හැකි අන්දමේ සියලු කරුණු පිළිබඳ ව ඒ අන්දමේ සියලු විධිවිධාන ඇතුළු ආයුර්වේද නීති සංග්‍රහයක් නියම කරමින් මේ පනත යටතේ නියෝග පැනවිය හැකි ය. මෙහි මීට පෙර පවරනු ලැබූ බලතලවල සාමාන්‍යත්වයට හානියක් නො වන පරිදි, ඒ නීති සංග්‍රහය මගින් මෙහි පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් යමක් පිළිබඳ ව විධිවිධාන සැපයිය හැකි ය:—

ආයුර්වේද නීති සංග්‍රහය.

(අ) ඒ කාර්‍ය්‍යය සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක්, අවස්ථාවෝචිත පරිදි වසක්, විෂ ද්‍රව්‍යයක් හෝ අන්තරාය දායක ඖෂධයක් වශයෙන් ප්‍රකාශ කිරීම;

(ආ) එ බඳු ලියාපදිංචි කිරීම හෝ එ බඳු බලපත්‍ර සඳහා, ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම ඇතුළු ව එ බඳු විධිමත් කිරීම හෝ පාලනය කිරීම ක්‍රියාවෙහි යෙදවීමේ කාර්‍ය්‍යය සඳහා ලියාපදිංචි කිරීමේ හෝ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ එ බඳු ලියාපදිංචි කිරීම හෝ එ බඳු බලපත්‍ර, ප්‍රදානය කිරීම, ප්‍රතික්ෂේප කිරීම හා අවලංගු කිරීම;

(ඇ) එ සේ නිෂ්පාදනය කිරීමේ දී, විකිණීමේ දී, සැපයීමේ දී, බෙදා හැරීමේ දී හෝ පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු නිවාරණෝපයන් හා සම්පූර්ණ කළ යුතු කොන්දේසි ;

(ඈ) එ සේ නිෂ්පාදනය කිරීමෙහි, විකිණීමෙහි, සැපයීමෙහි, බෙදා හැරීමෙහි හෝ පිළියෙල කිරීමෙහි නියුක්ත තැනැත්තන් විසින් තැබිය යුතු හා පවත්වාගෙන යා යුතු පොත් හා සටහන් සහ ඔවුන් විසින් සැපයිය යුතු වාර්තා ;

(ඉ) එ සේ නිෂ්පාදනය කිරීම, විකිණීම, සැපයීම, බෙදා හැරීම, හෝ පිළියෙල කිරීම කර ගෙන යනු ලබන ස්ථානයද ඒ කාර්‍ය්‍ය සඳහා තබනු ලබන හා පවත්වාගෙන යනු ලබන වාර්තා හා පොත් පත් ද පරීක්ෂා කිරීම ;

(ඊ) ඉහත කී කරුණුවලට ආනුෂංගික වූ හෝ ඊට සම්බන්ධ වූ වෙනයම් කරුණු.

(2) ආයුර්වේද නීති සංග්‍රහය මගින්, ඒ නීති සංග්‍රහයේ විධිවිධාන වලට සම්පූර්ණ බලය හා බලපෑම ලබා දීමේ කාර්යයට අවශ්‍ය විය හැකි පමණට, ඒ සංග්‍රහයේ සඳහන් අන්දමේ විෂ ද්‍රව්‍ය, අබින් හා අන්තරායදායක ඖෂධ ආඥාපනතේ යම් විධිවිධාන, එ සේ සඳහන් යම් තැනැත්තන් පන්තියකට හෝ යම් කරුණුවලට, එ සේ සඳහන් යම් සුළු වෙනස්කම්වලට යටත් ව, අදාළ නො විය යුතු යයි හෝ අදාළ විය යුතු ය යි විධිවිධාන සැපයිය හැකි ය.

එ සේ වුව ද, සුරා බදු ආඥාපනත පරිපාලනය කිරීමේ විෂය හෝ කාර්යය, අගමැතිවරයා විසින් පවරා දෙනු ලැබූ ඇමතිවරයාගේ පූර්ව එකඟත්වය නැති ව, ඒ ආඥාපනත පිළිබඳ ව ඒ නීති සංග්‍රහයේ එබඳු කිසි ම විධිවිධානයක් නො සැපයිය යුතු ය.

**නියෝග කඩ කිරීම වරදක් බව.**

78. යම් නියෝගයක විධිවිධාන කඩ කරන හෝ යම් නියෝගයක විධිවිධානවලට අනුකූල ව ක්‍රියා නො කරන සෑම තැනැත්තකු ම වරද කට වරදකරු විය යුතු ය.

**ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා සම්බන්ධ වැරදි.**

79. ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද ආරෝග්‍යශාලාවකදී, ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක දී, ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද ඖෂධශාලාවක දී හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද බෙහෙත් ගබඩාවක දී හෝ එබන්දක් සම්බන්ධයෙන් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක, ඒ වරද කළ තැනැත්තාට විරුද්ධ ව ඒ වරද පිළිබඳ ව ඇරඹිය හැකි යම් ක්‍රියා මාර්ගයකට හානියක් නො වන පරිද්දෙන්, අවස්ථාවෝචිත පරිදි, ඒ ආරෝග්‍යශාලාවේ, ඖෂධ නිෂ්පාදනාගාරයේ, ඖෂධශාලාවේ හෝ බෙහෙත් ගබඩාවේ අයිතිකරු වශයෙන් එවකට ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තා ද එවකට එය භාර ව සිටින තැනැත්තා ද, තමාගේ දැනුම නොමැති ව ඒ වරද කරනු ලැබූ බව හෝ ඒ වරද කරනු ලැබීම වැළැක්වීම සඳහා නිසි සෑම උනන්දුවක් ම තමා දැක් වූ බව ඔප්පු නො කළහොත්, ඔහු ඒ වරදට වරදකරු විය යුතු ය.

මේ පනත යටතේ වැරදි සඳහා දඬුවම.

80. මේ පනත යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තකු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු වූ විට, රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ හා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයන්ගේ මරණ දැනුම් දීම, ලේඛකාධිකාරිගේ යුතුකම බව.

81. 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ මරණය ලියාපදිංචි කරනු ලැබූ, ලියාපදිංචි කරනු ලැබූ යම් ආයුර්වේද වෛද්‍යවරයකුගේ, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකුගේ හෝ ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයකුගේ නම ආයුර්වේද වෛද්‍ය සභාවට දැනුම් දීම හෝ දැනුම්දීමට සැලැස්වීම, උප්පැන්න හා මරණ පිළිබඳ ලේඛකාධිකාරිගේ යුතුකම විය යුතු ය.

නියෝග.

82. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ඉෂ්ට කිරීමේ හා ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(2) විශේෂ වශයෙන් හා (1) වෙනි උප වගන්තිය මගින් පවරනු ලැබූ බලතලවල සාමාන්‍යත්වයට හානියක් නො වන පරිදි, මේ පනත මගින් නියෝග පනවනු ලැබීමට බලය පවරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(3) ඇමතිවරයා විසින් පනවනු ලැබූ කිසි නියෝගයක්, උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතිය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක්, වලංගු නො විය යුතු ය.

ආයුර්වේදය අනුව වෛද්‍ය කර්මය, ශල්‍ය කර්මය, ඖෂධ සංයෝගය හෝ සාත්තු සේවය පිළිබඳ වෘත්තියට 90 වෙනි අධිකාරය අදාල නො විය යුතු බව.

83. ආයුර්වේදය අනු ව වෛද්‍ය කර්මය, ශල්‍ය කර්මය, ඖෂධ සංයෝගය හෝ සාත්තු සේවය පිළිබඳ වෘත්තියට හෝ එහි යෙදෙන්නන්හට හෝ ඔවුන් සම්බන්ධයෙන් වෛද්‍ය ආඥාපනතේ විධිවිධාන අදාල නො විය යුතු ය.

90 වෙනි අධිකාරයේ 40 වෙනි වගන්තිය අවලංගු කිරීම

84. වෛද්‍ය ආඥාපනතේ 40 වෙනි වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

1949 අංක 25 දරන පනත සංශෝධනය කිරීම.

85. 1949 අංක 25 දරණ ආහාර හා ඖෂධ පනතේ 63 වෙනි වගන්තිය, ඒ වගන්තියේ (3) වෙනි උප වගන්තියේ (අ) ඡේදයෙහි "ඇතුලත් වේ" යන්නේ සිට ඒ ඡේදයේ කෙළවර දක්වා වූ සියලු වචන වෙනුවට "ආයුර්වේද පනතෙහි ඒ පදයේ අර්ථානුගත ව ලියාපදිංචි කළ ආයුර්වේද වෛද්‍යවරයෙක් ඇතුලත් වේ; තවද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

172 වෙනි අධිකාරය. සංශෝධනය කිරීම.

86. ආයුර්වේද නීති සංග්‍රහය ක්‍රියාත්මක වන තුරු මේ පනතෙහි උපලේඛනයෙහි සඳහන් කරනු ලැබූ සංශෝධනවලට යටත් ව විෂ ද්‍රව්‍ය, අබින් හා අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත ක්‍රියාත්මක විය යුතු ය.

219 වෙනි අධිකාරය හා 1941 අංක 17 දරන ආඥාපනත අවලංගු කිරීම.

87. ආයුර්වේද වෛද්‍ය සභා ආඥාපනත සහ 1941 අංක 17 දරණ සවදේශීය වෛද්‍ය ආඥාපනත මෙයින් අවලංගු කරනු ලැබේ.

සවදේශීය වෛද්‍ය මණ්ඩලයේ දේපල රජය වෙත පැවරීම.

88. ස්වදේශීය වෛද්‍ය මණ්ඩලයේ සියලු චංචල හා නිශ්චල දේපල මෙයින් රජය වෙත පවරනු ලැබ, රජයේ දේපළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

89. මේ පනතෙහි පද සංසන්දනයෙන් විරුද්ධාර්ථයක් අවශ්‍ය නො වුවහොත් —

"අනුමත කරනු ලැබූ ආයුර්වේද අධ්‍යාපන ආයතනය" යන්නෙන් මේ පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ යම් ආයුර්වේදීය අධ්‍යාපන ආයතනයක් අදහස් වේ;

"ආයුර්වේදය" යන්නට සිද්ධ හා යුනානි හා දේශීය චිකිත්සා ක්‍රමවල වෛද්‍ය කර්මය හා ශල්‍ය කර්මය ද ආසියාතික රට රටවලට දේශීය වූ ද, ඒ ඒ රටවල රජය මඟින් එ සේ ය යි පිළිගනු ලැබූ ද වෙන යම් වෛද්‍ය ක්‍රමයක් ද ඇතුළත් වෙයි. තවද "ආයුර්වේදීය" යන පාඨය එ පරිද්දෙන් පහදා ගත යුතු ය.

"ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය" යන්නෙන් ආයුර්වේද ඖෂධ හෝ බෙහෙත් වර්ග සාදනු ලබන, සකස් කරනු ලබන හෝ සංයෝග කරනු ලබන යම් ස්ථානයක් අදහස් වේ.

"ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය" යන්නෙන්, 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය අදහස් වේ;

"ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය" යන්නෙන්, නියමිත දිනයට පෙරාතු ව ම වූ දිනයෙහි ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය මඟින් පාලනය කරනු ලැබූ ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය අදහස් වේ;

"ඖෂධශාලාව" යන්නෙන් රෝගවලින් පෙළෙන තැනැත්තන් හට බාහිර ප්‍රතිකාර කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන (කුමන විස්තරයකින් යුක්ත වුව ද) යම් ස්ථානයක් අදහස් වේ. එහෙත් ඖෂධ නිෂ්පාදනාගාරයක් එයට ඇතුළත් නො වේ;

"ආරෝග්‍යශාලාව" යන්නෙන් යම් රෝගයකින් හෝ දුර්වලතාව කින් පෙළෙන තැනැත්තන් භාර ගැනීම, සාත්තු කිරීම හා ප්‍රතිකාර කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන (කුමන විස්තරයකින් යුක්ත

වුව ද) යම් ස්ථානයක් අදහස් වන අතර සාත්තු නිවාසයක් හෝ මාතෘ නිවාසයක් ද ඊට ඇතුළත් වේ; එහෙත් ඖෂධ ශාලාවක් එයට ඇතුළත් නො වේ;

"ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍යශාලාව" යන්නෙන් නියමිත දිනයට පෙරාතු ව ම වූ දිනයෙහි ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය මඟින් පාලනය කරනු ලැබූ ස්වදේශීය වෛද්‍ය ආරෝග්‍ය ශාලාව සහ ඊට සම්බන්ධ ඖෂධ නිෂ්පාදනාගාරය, ඖෂධ ගබඩාව හා ඖෂධ ශාලාව අදහස් වේ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලාව" යන්නෙන්, මේ පනත යටතේ ආයුර්වේද ආරෝග්‍යශාලාවක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ ආරෝග්‍යශාලාවක් අදහස් වේ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද සාත්තු සේවකයා" යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද සාත්තු සේවකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය" යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ ඖෂධ නිෂ්පාදනාගාරයක් අදහස් වේ;

"ලියාපදිංචි කරනු ලැබූ ඖෂධ සංයෝගකයා" යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු අදහස් වන අතර 73 වෙනි වගන්තිය යටතේ එ ලෙස ලියාපදිංචි කරනු ලැබී ඇතැ යි සලකනු ලබන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"ආයුර්වේද සාත්තු සේවකයන්ගේ ලේඛනය" යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද සාත්තු සේවකයන් ලියාපදිංචි කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් තබනු ලබන ලේඛනය අදහස් වේ;

"ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනය" යන්නෙන් ආයුර්වේද වෛද්‍යවරයන් ලියාපදිංචි කිරීම සඳහා මේ පනත යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් තබනු ලබන සාමාන්‍ය නාම ලේඛනය හෝ විශේෂ නාම ලේඛනය අදහස් වන අතර, ආයුර්වේද වෛද්‍යවරයන්ගේ සාමාන්‍ය නාම ලේඛනයක් හෝ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ විශේෂ නාම ලේඛනයක් හෝ 51 වෙනි වගන්තියේ (3) වෙනි උප වගන්තිය යටතේ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ විශේෂ නාම ලේඛනයක් වශයෙන් සලකනු ලබන යම් නාම ලේඛනයක් ද ඊට ඇතුළත් වේ;

"ආයුර්වේද ඖෂධ සංයෝගකයන්ගේ නාම ලේඛනය" යන් යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද ඖෂධ සංයෝගකයන් ලියාපදිංචි කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් තබනු ලබන නාම ලේඛනය අදහස් වේ;

## උපලේඛනය

**විෂ ද්‍රව්‍ය, අබිං හා අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත (172 වෙනි අධිකාරය) වෙනස් කිරීම**

2 වෙනි වගන්තිය. (1) "වෛද්‍යවරයා", "දන්ත වෛද්‍යවරයා" හා "ඖෂධ සංයෝගකයා" යන පදවල විස්තර අත්හරිනු ලැබුවාක් මෙන් :—

(2) "භාජනය" යන්නෙහි විස්තරයට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් විස්තරය ඇතුලත් කරනු ලැබුවාක් මෙන් :—

"දන්ත වෛද්‍යවරයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ ;

(3) "ප්‍රාදේශිය බලමණ්ඩලය" යන්නෙහි විස්තරයට ඉක්බිති වම පහත දැක්වෙන අලුත් විස්තර ඇතුලත් කරනු ලැබුවාක් මෙන් :—

"වෛද්‍යවරයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු අදහස් වන අතර, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයෙකු ද ඊට ඇතුලත් වේ ;

"ඖෂධ සංයෝගකයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ඖෂධසංයෝගයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු අදහස් වන අතර, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයෙක් ද ඊට ඇතුලත් වේ ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයා" යන්නෙන් ආයුර්වේද පනත යටතේ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු අදහස් වන අතර, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධාගාරයක් ව්‍යාපාර කාර්යයන් සඳහා, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ඖෂධ සංයෝගකයකු විසින් පාවිච්චි කළ හැකි යම් නාමයක්, පටබැඳි නාමයක්, එකතුවක් හෝ විස්තරයක් පාවිච්චි කිරීමට, ඒ පනතේ 71 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තියේ ප්‍රකාර, හිමිකම් ඇති යම් තැනැත්තෙක් ද ඊට ඇතුලත් වේ ;

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන්නට ආයුර්වේද පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

10 වෙනි වගන්තිය. ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "වෙදරාලවරයෙක්" යන වචන අත්හරිනු ලැබුවාක් මෙන්.

12 වෙනි වගන්තිය. 12 වෙනි වගන්තිය අවලංගු කරනු ලැබුවාක් මෙන්.

13 වෙනි වගන්තිය. ඒ වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි "වෙදරාල" යන වචනය අත්හරිනු ලැබුවාක් මෙන්.

22 වෙනි වගන්තිය. ඒ වගන්තියේ (3) වෙනි උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "වෙදරාලවරු" යන වචනය අත්හරිනු ලැබුවාක් මෙන්.

31 වෙනි වගන්තිය. ඒ වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි "ලියාපදිංචි කරනු ලැබූ වෙදරාලවරු" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

34 වෙනි වගන්තිය. (1) ඒ වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි "ලියාපදිංචි කරනු ලැබූ වෙදරාලවරු" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්,

(2) ඒ වගන්තියේ (4) වෙනි උපවගන්තියේ (ආ) ඡේදයෙහි "ලියාපදිංචි කරනු ලැබූ වෙදරාළ" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "ලියාපදිංචි කරනු ලැබූ වෙදරාළ" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්. 35 වෙනි වගන්තිය.

(1) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කරනු ලැබුවාක් මෙන් :— 41 වෙනි වගන්තිය.

"අඛිත් සහතික ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර ගැන කටයුතු කිරීමට මණ්ඩල පත් කිරීම"

(2) ඒ වගන්තියේ (1) වෙනි උපවගන්තිය අවලංගු කරනු ලැබුවාක් මෙන්.

(3) ඒ වගන්තියෙහි (2) වෙනි උපවගන්තිය (1) වෙනි උපවගන්තිය යනුවෙන් ද, (3) වෙනි උපවගන්තිය (2) වෙනි උපවගන්තිය යනුවෙන් ද, (4) වෙනි උපවගන්තිය (3) වෙනි උපවගන්තිය යනුවෙන් ද, (5) වෙනි උපවගන්තිය (4) වෙනි උපවගන්තිය යනුවෙන් ද, (6) වෙනි උපවගන්තිය (5) වෙනි උපවගන්තිය යනුවෙන් ද, යළිත් අංක යොදනු ලැබුවාක් මෙන්.

(4) ඒ උපවගන්තියේ යළිත් අංක යොදනු ලැබූ 2 වෙනි උපවගන්තියෙහි—

(අ) "වෙදරාළවරුන් විසින් ලියාපදිංචි කිරීම" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අඛිත් සහතික" යන වචන;

(ආ) "ලියාපදිංචි කිරීම නියම කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම" යන වචන වෙනුවට "එ බඳු ඉල්ලුම් පත්‍ර සඳහා අවසර දීම හෝ ප්‍රතික්ෂේප කිරීම" යන වචන:

සහ

(ඇ) "වෙදරාළ" යන වචනය වෙනුවට "ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන;

ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(5) ඒ වගන්තියේ යළිත් අංක යොදනු ලැබූ (3) වෙනි උපවගන්තියෙහි "වෙදරාළවරයකු ලියාපදිංචි කිරීම" යන වචන වෙනුවට 'ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකුගේ අඛිත් සහතිකය" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(6) ඒ වගන්තියේ යළිත් අංක යොදනු ලැබූ (5) වෙනි උපවගන්තියෙහි "ඔහුගේ ප්‍රදේශයෙහි ලියාපදිංචි කරනු ලැබූ වෙදරාළවරු" යන වචන වෙනුවට "අඛිත් සහතික නිකුත් කරනු ලැබ සිටින ඔහුගේ ප්‍රදේශයෙහි ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(1) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කරනු ලැබුවාක් මෙන් :— 42 වෙනි වගන්තිය.

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන් හට අඛිත් සැපයීම."

(2) ඒ වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි ආරම්භයේ සිට "වෙදරාළ" තෙක් වූ වචන වෙනුවට පහත දැක්වෙන වාක්‍යය ආදේශ කරනු ලැබුවාක් මෙන් :—

"ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු විසින් අබින් සහතිකයක් සඳහා කරනු ලැබූ ඉල්ලීමකට මණ්ඩලය විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවකදී, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් ඒ සහතිකය ඒ වෛද්‍යවරයා වෙත නිකුත් කළ යුතු ය".

(3) ඒ වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි—,

(අ) "වෙදරාළ කෙනකු ලියාපදිංචි කිරීම" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකුගේ අබින් සහතිකය" යන වචන, සහ

(ආ) "වෙදරාළ" යන වචන වෙනුවට "ඒ වෛද්‍යවරයා" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(4) ඒ වගන්තියේ (3) වෙනි උපවගන්තියේ (අ) ඡේදයෙහි—

(අ) "වෙදරාළ" යන වචන වෙනුවට "ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන; සහ

(ආ) "ලියාපදිංචි කිරීමේ සහතිකය" යන වචන වෙනුවට "අබින් සහතිකය" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(5) ඒ වගන්තියේ (3) වෙනි උපවගන්තියේ (ආ) ඡේදයෙහි, "වෙදරාළ" යන වචනය වෙනුවට "ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

45 වෙනි වගන්තිය.

"හෝ වෙදරාළ කෙනකු" යන වචන සහ "හෝ වෙදරාළ වරුන්" යන වචන අත්හරිනු ලැබුවාක් මෙන්.

56 වෙනි වගන්තිය.

ඒ වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි "වෛද්‍ය ආඥපනත" යන වචන වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබුවාක් මෙන්.

"වෛද්‍ය ආඥපනත සහ, වෛද්‍යවරයා ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු වන අවස්ථාවක, ලංකා වෛද්‍ය සභාව වෙත නො ව ආයුර්වේද පනත යටතේ පිහිටුවනු ලැබූ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත කාරණය යොමු කළ යුතු ය."

72 වෙනි වගන්තිය

ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "හෝ වෙදරාළවරයකු වශයෙන්" යන වචන අත්හරිනු ලැබුවාක් මෙන්.

## දෙවෙනි උපලේඛනය

1. 10 වෙනි නියෝගයේ (3) වෙනි ඡේදයෙහි,

(අ) "පාරිභෝගිකයන් හා වෙදරාළවරුන්" යන වචන වෙනුවට "පාරිභෝගිකයන් හා අබින් සහතික නිකුත් කරනු ලැබ සිටින ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ" යන වචන; සහ

(ආ) "වෙදරාළ" යන වචනය වෙනුවට "වෛද්‍යවරයා" යන වචනය ආදේශ කරනු ලැබුවාක් මෙන්.

2. 15 වෙනි වගන්තියෙහි—

(අ) ඒ නියෝගයේ (1) වෙනි ඡේදයෙහි—

"වෙදරාළවරු" යන වචනය වෙනුවට "අබින් සහතික නිකුත් කරනු ලැබ සිටින ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන, සහ

"පාරිභෝගිකයාගේ හෝ වෙදරාලගේ සහතිකය" යන වචන වෙනුවට "ලියාපදිංචි කිරීම පිළිබඳ ව පාරිභෝගිකයාගේ සහතිකය හෝ ලියා පදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයාගේ අබිත් සහතිකය" යන වචන ද,

ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(ආ) ඒ නියෝගයේ (2) වෙනි ඡේදයෙහි "වෙදරාල" යන වචනය සඳහන් වන හැම තැන ම ඒ වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

3. 16 වෙනි නියෝගයෙහි "වෙදරාල" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

4. 4 වෙනි කොටසෙහි, "වෙදරාලවරු" යන ශීර්ෂය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන ශීර්ෂය ආදේශ කරනු ලැබුවාක් මෙන්.

5. 26 වෙනි නියෝගයෙහි, "වෙදරාලවරුන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන් විසින් අබිත් සහතික සඳහා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

6. 27 වෙනි නියෝගයෙහි, "ලියාපදිංචි කිරීමේ සහතිකය" යන වචන වෙනුවට "අබිත් සහතික" යන වචන ද, "වෙදරාල" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

7. 28 වෙනි නියෝගයෙහි, "වෙදරාලවරු" යන වචනය වෙනුවට "අබිත් සහතික නිකුත් කරනු ලැබ සිටින, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

8. 29 වෙනි නියෝගයෙහි, "වෙදරාලවරු" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

9. 30 වෙනි නියෝගයෙහි, "වෙදරාල" යන වචනය වෙනුවට "අබිත් සහතිකයක් නිකුත් කරනු ලැබ සිටින ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

10. 31 වෙනි නියෝගයෙහි,—

(අ) "නියෝගය" යන වචනය වෙනුවට "නියෝගයේ (1) සිට (4) දක්වා වූ ඡේදයන්" යන වචන හා අංක;

(ආ) "වෙදරාලවරු" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන; හා

(ඇ) "එය අදාළවේ" යන වචන වෙනුවට "ඒවා අදාළ වේ" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

11. 31 වෙනි නියෝගයට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත කරනු ලැබුවාක් මෙන් :—

"32. අබිත් සහතිකයක් නැති වූ හෝ විකෘති වූ අවස්ථාවක දී, ඒ සහතිකයේ සැබෑ පිටපතක් ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් හෝ අබිත් නිලධාරියා විසින් නිකුත් කළ යුතු ය. මුල් සහතිකයේ ඇති අංකය ම සැබෑ පිටපතෙහි ද තිබිය යුතු ය."

12. අංක 5 දරන අබිත් ආකෘති පත්‍රයෙහි,

(අ) "වෙදරාලවරු" යන වචන වෙනුවට, "අබිත් සහතික නිකුත් කරනු ලැබ සිටින, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන;

(ආ) "ලියාපදිංචි කිරීමේ සහතිකය" යන වචන වෙනුවට "අබිත් සහතිකය" යන වචන; හා

(ඇ) "වෙදරාල" යන වචනය එහි සඳහන් වන සෑම තැනක ම ඒ වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

13. අංක 9 දරන අබින් ආකෘති පත්‍රයෙහි,

(අ) "වෙදරාලවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා" යන වචන වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු විසින් ... සහතිකයක් සඳහා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.

(ආ) 6 වෙනි, 7 වෙනි, හා 8 වෙනි කරුණු අත්හරිනු ලැබුවාක් මෙන්.

(ඇ) අංක 9 දරන කරුණ අංක 6 දරන කරුණ වශයෙන් ද, අංක 10 දරන කරුණ අංක 7 දරන කරුණ වශයෙන් ද යළිත් අංක යොදනු ලැබුවාක් මෙන්.

14. අංක 10 දරන අබින් ආකෘති පත්‍රය වෙනුවට, පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කරනු ලැබුවාක් මෙන් :—

"(27 වෙනි නියෝගය) අංක 10 දරන අබින් ආකෘති පත්‍රය

## ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකුගේ අබින් සහතිකය
## (අන්සතු කළ නො හැකි ය)

මෙහි උපලේඛනයෙහි සඳහන් කරනු ලබන විස්තරයන් හා ප්‍රමාණයෙන් යුත් අබින් එසේ සඳහන් කරනු ලබන කාලයකට සපයනු ලැබීමට, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු වන......................පදිංචි..................ට හිමිකම් ඇතැයි ද, එසේ සඳහන් කරනු ලබන අබින් නිලධරයාගෙන් ඒ අබින් ප්‍රමාණය ඔහුට ලබා ගත හැකි බව ද, විෂ ද්‍රව්‍ය, අබින් හා අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනතේ 4 පරිච්ඡේදය යටතේ සහතික කරමි.

උපලේඛනය

මාස හයකට වෙන් කර ඇති අබින් ප්‍රමාණය හා වර්ගය :—

අබින් ලබා ගත හැකි අබින් නිලධාරියා :—

..........................................................

ආණ්ඩුවේ දිසාපතිගේ හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිගේ අත්සන.

දිනය : 19..............................."

15. අංක 11 දරන අබින් ආකෘති පත්‍රයෙහි,

(අ) "වෙදරාලවරු" යන වචනය වෙනුවට "අබින් සහතික නිකුත් කර ලැබ සිටින, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු" යන වචන;

(ආ) "වෙදරාල" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන; හා

(ඇ) "ලියාපදිංචි කිරීමේ සහතිකය" යන වචන වෙනුවට "අබින් සහතිකය" යන වචන ද ආදේශ කරනු ලැබුවාක් මෙන්.

16. අංක 20 දරන අබින් ආකෘති පත්‍රයෙහි "හෝ වෙදරාල" යන වචන හා "හෝ වෙදරාල" යන වචන එහි සඳහන් වන සෑම තැනක ම අත්හරිනු ලැබුවාක් මෙන්.

17. අංක 21 දරන අබින් ආකෘති පත්‍රයෙහි "වෙදරාල" යන වචනය වෙනුවට "ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්.